**ශීර්ෂය 139 - ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

-------------------------------------------------------------------------------------------------------------------

මෙම වාර්තාවේ 1 ඡේදයේ හා 2 ඡේදයෙහි අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට එක් එක් ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1.** **අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව**

| **ශීර්ෂය** | **දෙපාර්තමේන්තුව** |
|---|---|
| 290 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව |

**1.1** **විගණන විෂය පථය**

ඉහත 1 ඡේදයේ සඳහන් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තා පහත සඳහන් දිනවල එම අමාත්‍යාංශයේ ලේකම්වරයාට හා දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| **ශීර්ෂය** | **අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව** | **කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය** |
|---|---|---|
| 139 | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 2015 දෙසැම්බර් 21 |
| 290 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | 2015 ඔක්තෝබර් 15 |

**1.2** **ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 9,416 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 8,069 ක් උපයෝජනය කර තිබීමෙන් අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.මිලියන 1,347 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 139 | 3,186 | 2,483 | 703 | 22 |
| 290 | 6,230 | 5,586 | 644 | 10 |
| **එකතුව** | **9,416** | **8,069** | **1,347** | **14** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශය හා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් රු.මිලියන 127.12 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 81.37 ක් උපයෝජනය කර තිබුණි. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රතිපාදන ලබාගත් අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදන ලබා දුන් අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය |
|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 126.50 | 80.86 | 45.64 |
| | ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 0.04 | 0.04 | - |
| | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | 0.11 | 0.05 | 0.06 |
| ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 0.47 | 0.42 | 0.05 |
| **එකතුව** | | **127.12** | **81.37** | **45.75** |

## 2.2 ආදායම් ගිණුම

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂයට ආදායම් සංකේත 01 ක් සඳහා රු.මිලියන 7.37 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 15.08 ක ආදායමක් රැස් කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 205 ක ආදායමක් රැස්කර තිබුණි.

## 2.3 අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වූ දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 13901 | 6.00 | 5.98 | 3.80 | 5.03 | 31.00 | 24.43 |
| 29001 | 25.00 | 21.94 | 13.05 | 20.16 | 110.00 | 74.24 |

## 2.4 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂ එකතුව රු.මිලියන 403.63ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | අග්‍රිම ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු.මිලියන |
| ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 7002/0000/00/0089/0014/000 | 386.03 |

| | | |
|---|---|---|
| ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | 7002/0000/00/0257/0014/000 | 17.60 |
| | | ---------- |
| **එකතුව** | | **403.63** |
| | | ===== |

## 2.5 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 530.74 ක් විය. විස්තර පහත දැක්වේ.

| **අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව** | **තැන්පත් ගිණුම් අංකය** | **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|---|
| | | **රු.මිලියන** |
| ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 6000/0000/000/0015/0051/000 | 51.20 |
| ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | 6000/0000/000/0015/0045/000 | 479.54 |
| | | ---------- |
| **එකතුව** | | **530.74** |
| | | ====== |

## 2.6 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ හා 4 ඡේදයේ දක්වා ඇත.

## 3. ශීර්ෂය 139 - ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

### 3.1 විගණන සාක්ෂි නොවීම

මුදල් රෙගුලාසි 272(2) ප්‍රකාරව කටයුතු නොකළ රු.9,664,584 ක් වටිනා ගෙවීම් වවුචරක් අස්ථානගතවී තිබුණි.

### 3.2 විගණන විමසුම්වලට පිළිතුරුදීම

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී නිකුත් කළ විගණන විමසුම් 19 කට 2015 අගෝස්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

### 3.3 අධිවැය

විධිමත් අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 05 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදන රු.මිලියන 43.09 කින් ඉක්මවා උපයෝජනය කර තිබුණි.

### 3.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන

වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය කිරිම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) 2014 වර්ෂයේ දිවිනැගුම වැඩසටහන යටතේ ධීවර අංශයේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් රු.මිලියන 92 ක ප්‍රතිපාදන ලැබි තිබුණි. 2014 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.මිලියන 46.3 ක් උපයෝජනය කර තිබුණු අතර ඒ අනුව රු.මිලියන 45.7 ක් ඉතිරි වී තිබුණි. එම ඉතිරිය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙත ආපසු යැවීමෙන් දිවිනැගුම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ඉලක්ක කරා ලගාවීමේ ප්‍රගතිය සියයට 56.5 ක් වි තිබුණි.

(ආ) දිවිනැගුම වැඩසටහන යටතේ ජාතික ජලජීවි වගා සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිවල 2013 වර්ෂයේ අතැති බිල්පත් පියවීමට රු.34,500,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (NARA) විසින් 2013 වර්ෂයේදී දිස්ත්‍රික්ක 06 ක ක්‍රියාත්මක කළ සුරතල් මසුන් සඳහා ආහාර සැකසීමේ ව්‍යාපෘතියකට මෙම ව්‍යාපෘතියෙන් රු.536,679 ක් වැයකර තිබුණි. ඒ සඳහා අදාල දිස්ත්‍රික් ලේකම්වරුන් මගින් අවශ්‍ය ප්‍රතිපාදන ලබාගන්නා ලෙස ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් දැනුම්දී තිබුණද ඊට පටහැනිව මෙම වියදම් කර තිබුණි.

## 3.5 අග්‍රිම ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 371 (2) ප්‍රකාරව නිශ්චිත කාර්යයන් සඳහා ලබාදෙනු ලබන තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය නිම කළ වහාම පියවීමට කටයුතු කළ යුතු වුවත් අවස්ථා 14 කදී ලබාදුන් එකතුව රු.44,772,984 ක තත්කාර්ය අතුරු අග්‍රිම පියවීමකින් තොරව වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. .

(ආ) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 20 කදී ලබාදුන් එකතුව රු. 611,455 ක තත්කාර්ය අතුරු අග්‍රිම හා ඉන්ධන අත්තිකාරම් කාර්යය නිමවී මාස 02 ක සිට මාස 08 ක් දක්වා පරාසයක කාල පමාවක් සිදු කර නිරවුල් කර තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව එක් මාණ්ඩලික නිලධාරියෙකුට එක් වරකදී නිකුත් කළ හැකි උපරිම අතුරු අග්‍රිමය රු.20,000 ක් වී තිබුණත්, ඊට පටහැනිව අවස්ථා 25කදී රු.20,000 ක් ඉක්මවූ එකතුව රු.920,140 ක අතුරු අග්‍රිම හා ඉන්ධන අත්තිකාරම් නිකුත් කර තිබුණි.

(ඈ) අමාත්‍යාංශය විසින් ලංකා ධීවර සංස්ථාවට අවශ්‍ය මසුන් මිලදී ගැනීම සහ දෛනික වියදම් සඳහා ආපසු ලබාගැනීමේ පදනම මත 2010 නොවැම්බර් 5 දින ලබාදුන් රු.මිලියන 10 ක අත්තිකාරම්වලින් 2014 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 2 ක් පියවා තිබුණි. අත්තිකාරම් ලබාදී වසර 4 ක කාලයක් ගතවී තිබුණද රු. මිලියන 8ක ඉතිරි ශේෂය ලංකා ධීවර සංස්ථාවෙන් ආපසු ලබාගැනීමට 2015 අගෝස්තු 15 දින වන විටත් අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

(ඉ) දික්ඕවිට ධීවර වරාය ව්‍යාපෘතිය මගින් 2012 වර්ෂයේදි සී/ස සීනෝර් පදනමට තාවකාලික අත්තිකාරම් ලෙස අවස්ථා 2 කදී ලබාදුන් රු.33,000,000 ක අත්තිකාරම්වලින් රු.22,366,752 ක් නිරවුල් කර තිබුණු අතර 2014 දෙසැම්බර් 31 දිනට නොපියවූ ශේෂය රු.10,633,248 ක් විය. මෙහිදී ණය මුදල පියවීම වෙනුවට සීනෝර් පදනම අනුමැතියකින් තොරව රු.3,358,648 ක් පදනමට අයවිය යුතු බිල්පත් මගින් හිලව් කර තිබුණි.

## 3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 13901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු වර්ෂ 1 ක සිට වර්ෂ 29 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණු රු.1,479,110 ක හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි.

(ආ) ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 1.6 වගන්තිය හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාර නිලධාරියෙකු මාරු වී පැමිණ මාස 02 ක් ගත වීමෙන් පසු හෝ නිලධාරියෙකු ස්ථාන මාරු වීම් ලබා මාස 03 ක් ගතවීමෙන් පසු දෙපාර්තමේන්තු අතර නිරවුල් නොවූ ණය ශේෂ නොපෙන්විය යුතු වුවත්, 1985 වර්ෂයේ සිට 1994 වර්ෂය දක්වා වසර 29 ට වඩා අධික කාලයක සිට පැවත එන ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 14 දෙනෙකුගෙන් අයවිය යුතු රු.153,526 ක ණය ශේෂ නිරවුල් කරගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) ස්ථාන මාරු වී ගිය නිලධාරීන් අතුරින්, විවිධ හේතු මත නිරවුල් නොවී පැවැති රු.45,910 ක ණය ශේෂ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරන ලෙස අත්තිකාරම් නිරවුල් කිරීමේ කමිටුව විසින් දන්වා තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඈ) රාජ්‍ය සංස්ථා හා ව්‍යාපෘතිවලට මුදාහරින ලද නිලධාරීන්ගෙන් රු.261,810 ක ණය ශේෂ හිඟහිටව පැවැතුණි. ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.8 වගන්තිය අනුව එම ණය ශේෂ නිරවුල් නොකර එම තනතුරුවලට මුදාහැර තිබුණි.

(ඉ) 1985 වර්ෂයේ සිට 1991 වර්ෂය දක්වා කාලය තුළ විශ්‍රාම ගිය නිලධාරීන් 35 දෙනෙකුගෙන් අයවිය යුතු රු.127,580 ක ණය ශේෂ ඔවුන්ගේ විශ්‍රාම පාරිතෝෂික මුදලින් අය කර ගෙන නොතිබුණි.

(ඊ) 1986 වර්ෂයේ සිට 1995 වර්ෂය දක්වා කාලය තුළ මියගිය නිලධාරීන් 10 දෙනෙකුගෙන් අයවිය යුතු රු.62,569 ක ණය ශේෂ නිරවුල් කර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(උ) 1994 ඔක්තෝබර් 01 දින සිට වැඩ තහනමකට ලක්වූ රියදුරෙකුගෙන් අයවිය යුතු ණය වාරික 2013 ඔක්තෝබර් මාසයෙන් පසු අයකර ගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට අයකර ගැනීමට තිබුණු හිඟහිටි ශේෂය රු.14,000 ක් විය.

(ඌ) 1985 වර්ෂයේ සිට 2009 අප්‍රේල් 01 දින දක්වා කාලය තුළ සේවය හැර ගිය නිලධාරීන් 24 දෙනෙකුගෙන් අයවිය යුතු රු.664,471 ක ණය ශේෂ වර්ෂ 27 ක කාලයක සිට අය නොවී ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(එ) 1994 හා 1995 වර්ෂවල හිටපු අමාත්‍යවරයෙකුගේ නිල කාලය අවසන්වීමත් සමග අමාත්‍ය මණ්ඩල තීරණයක් මත සේවය අවසන් කළ පුද්ගලික ආරක්ෂක නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු.78,754 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.7 වත්කම් කළමනාකරණය**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේ වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, අමාත්‍යාංශය 2015 අගෝස්තු 15 දින වන විටත් එම වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී තිබුණු වත්කම්**

අමාත්‍යාංශය සතු වාහනයක් අවිධිමත් ලෙස ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවට 2014 අප්‍රේල් 21 දින සිට අනුයුක්ත කර තිබුණි.

**(ඇ)** **වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

**--------------------------------------------------------------**

වෙනත් ආයතන සතුව තිබුණු වාහන 03 ක් විධිමත් අනුමැතියකින් තොරව අමාත්‍යාංශය විසින් භාවිතයට ගෙන තිබුණි.

**(ඈ)** **බේරුම් නොකළ බැරකම්**

**-----------------------------**

අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 3 කට වැඩි කාලයක සිට පැවැත එන බේරුම් නොකළ රු.600,193,305ක බැරකම් පැවැතුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු ඉතිරිය ඉක්මවා රු.229,983,736ක බැරකම්වලට එළඹ තිබුණි.

(ii) ධීවර වරාය හා නැංගුරම්පලවල් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා සංශෝධිත ඇස්තමේන්තුගත වියදම හා සත්‍ය වියදම රු.453,000,000 ක් වූ අතර 2014දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රගතිය රු.575,427,739 ක් එනම් සියයට 127 ක් විය. ඒ අනුව ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඉක්මවා රු.122,427,739 ක් සඳහා බැදීම් ඇතිකරගෙන තිබුණි.

**3.8** **අනුකූල නොවීම්**

**-----------------**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**----------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| | VII වැනි පරිච්ඡේදයේ 12.7 වගන්තිය | 1,410,273 | පුරප්පාඩුව පැවති අධ්‍යක්ෂක (සංවර්ධන හා සාගර) තනතුරේ වැඩ බැලීමට පත්කර තිබුණු නිලධාරිනියකට 2012 ඔක්තෝබර් මාසයේ සිට 2014 දෙසැම්බර් මාසය දක්වා රෙගුලාසිවලට පටහැනිව ඉන්ධන දීමනා හා ප්‍රවාහන දීමනා වශයෙන් එකතුව රු.1,410,273 ක් ගෙවා තිබුණි. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| | මුදල් රෙගුලාසි 207(2) හා (3) | 155,000 | වාර්ෂික ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන සළසා නොතිබුණු සිංහල අවුරුදු උත්සවය පැවැත්වීමට ක්‍රීඩාංගනය වෙන්කර ගැනීමේ ගාස්තුව කාර්ය මණ්ඩල පුහුණු වැය විෂයය යටතේ සළසා තිබුණු ප්‍රතපාදනවලින් වැය කර තිබුණි. |
| (ඇ) | **ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ** | | |
| | 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1දරන චක්‍රලේඛයේ 3.4 ජේදය | - | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව අමාත්‍ය කාර්යාලයට වාහන 08 ක්ද නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලයට වාහන 04 ක් ද ලබාදී තිබුණි. |
| (ඈ) | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| | (i) 2008 ජුනි 06 දිනැති අංක 14/2008 දරන චක්‍රලේඛය | 1,890,124 | චක්‍රලේඛය අනුව ප්‍රවාහන දීමනා හිමි නොවන නිලධාරීන් 04 දෙනෙකුට සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂවලදී මාසිකව රු.30,000 බැගින් ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි. |
| | (ii) 2000 ජුලි 19 දිනැති අංක 12/02 දරන චක්‍රලේඛයේ 02 හා 07 ජේද | - | අභ්‍යාසලාභීන් ලෙස ප්‍රායෝගික පුහුණුව ලබාදිය හැක්කේ රාජ්‍ය පුහුණු ආයතනවල පාඨමාලා හදාරා සුදුසුකම් ලත් සිසුන් සඳහා පමණක් වුවද, ඊට පටහැනිව ධීවර |

| | | |
|---|---|---|
| | | වරාය නීතිගත සංස්ථාවට අනුයුක්ත ගණකාධිකාරිවරුන් දෙදෙනකු ගණකාධිකාරි තනතුරේ පුහුණුවට ධීවර අමාත්‍යාංශයට නිදහස් කර තිබුණි. ගෙවීම් වවුචර් සහතික කිරීම, ගෙවීම් කිරීම සඳහා වූ බලතල හා අමාත්‍යාංශයේ නිල බැංකු ගිණුමට අදාල චෙක්පත් අත්සන් කිරීමේ බලතල ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශ ලේකම් විසින් පවරා තිබුණි. |
| **(ඉ) භාණ්ඩාගාර චක්‍රලේඛ** | | |
| 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන චක්‍රලේඛය | 1,638,357 | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. |
| **(ඊ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | |
| 2010 මැයි 20 දිනැති අංක 4/2010 විශ්‍රාම වැටුප් චක්‍රලේඛය 4.(I) හා 4.(II) ඡේද | 93,901 | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට හිමිකම් නොමැති නිලධාරීන් 03 දෙනෙකු වෙනුවෙන් එම අරමුදලට සදොස් ලෙස බැර කළ දායක මුදල එම නිලධාරීන්ට ආපසු ගෙවීමේදී ඔවුන්ගෙන් අයකරගත් මුදලට අමතරව රජයේ දායකත්වයද ඔවුන්ට ගෙවා තිබුණි. |

## 3.9 විදේශාධාර ව්‍යාපෘති

### 3.9.1 පශ්චාත් සුනාමි පුනරුත්ථාපන හා සම්පත් කළමනාකරණ ව්‍යාපෘති

කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල මගින් මූල්‍යනය කළ හා අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කළ පශ්චාත් සුනාමි පුනරුත්ථාපන හා සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කාලය 2013 දෙසැම්බර් 31 දින අවසන් වී තිබුණි. ව්‍යාපෘතියේ ගිණුම් කටයුතු අවසන් කිරීම සඳහා 2014 මාර්තු 31 දින දක්වා කාලයක් ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දින සිට මාර්තු 31 දින දක්වා කාලයට ව්‍යාපෘතියට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අගෝස්තු 15 දින වන විටත්, විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ)** ව්‍යාපෘතියට අදාල බැංකු ගිණුම් 02 ක බැංකු සැසඳුම් ප්‍රකාශ 2014 අප්‍රේල් මාසයේ සිට පිළියෙල

කර නොතිබුණි. එම බැංකු ගිණුම්වල පැවති රු.4,499,790 ක ශේෂ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර ගිණුම් වසා දැමීමට 2015 අගෝස්තු 15 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසු ඇවර කිරීමේ ගිණුම්, ව්‍යාපෘති අරමුණු ඉටු කර ගැනීම සම්බන්ධ කාර්යසාධන වාර්තා හා වත්කම් පැවරීම සම්බන්ධ වාර්තා 2015 අගෝස්තු 15 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 3.9.2 නිමකළ විදේශාධාර ව්‍යාපෘතිවලින් අරමුණු සාක්ෂාත් කරගැනිම හා ඒවායේ වත්කම් පැවරීම පිළිබඳ වාර්තා ඉදිරිපත් නොකිරිම.

වැඩ අවසන් කළ පහත සඳහන් විදේශාධාර ව්‍යාපෘතිවලින් අපේක්ෂා කළ අරමුණු සාක්ෂාත් කර ගැනිම හා ව්‍යාපෘතියට මිලදී ගත් වත්කම් පැවරීමේ වාර්තා 2014 දෙසැම්බර් 31 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | ව්‍යාපෘතිය නිමකළ දිනය |
|---|---|
| සුනාමියෙන් විපතට පත් වූ ප්‍රදේශ යළි ගොඩ නැඟීමේ ව්‍යාපෘතිය | 2010.12.31 |
| වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය | 2009.06.30 |
| පශ්චාත් සුනාමි ජීවනෝපාය සහාය සහයෝගීතා වැඩසටහන | 2011.09.30 |
| ශ්‍රී ලංකා මහාද්වීපික තටාකයේ බාහිර සීමාව නිර්ණය කිරීමේ ව්‍යාපෘතිය | 2012.12.31 |

## 3.10 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

### 3.10.1 ධීවර වරායන් හා නැංගුරම් තොටුපලවල් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියට 2013 ජුනි 17 දින ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ හා 2013 අගෝස්තු 02 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු අතර එහි පිරිවැය රු.මිලියන 2,000 ක් වී තිබුණි. 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලය තුළ ධීවර වරායක්, නැංගුරම් තොටුපලවල් 02 ක්, පවතින වරායවල් 02 ක හා ගොඩබෑම් මධ්‍යස්ථානයක ජැටි සහ දියකඩන ඉදිකිරීම් යන කාර්යයන් එම ව්‍යාපෘතියට ඇතුළත් විය. මෙහි ඉදිකිරීම් කටයුතු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ හා ලංකා ධීවර නීතිගත සංස්ථාවේ ඍජු අධීක්ෂණය යටතේ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කොන්ත්‍රාත් ප්‍රදානය කර දේශීය ඉදිකිරීම් ආයතන මගින් ඉටුකර ගැනීමටත් ඒ සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ හා මෙහෙයවීමේ ඒකකයක් පිහිටුවීමටත් 2013 සැප්තැම්බර් 05 දින අමාත්‍ය මණ්ඩලය අනුමත කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේදී යථෝක්ත ව්‍යාපෘතියට එකතුව රු.මිලියන 3,505 ක පිරිවැය වූ තවත් උපව්‍යාපෘති 08 ක් ඇතුළත් කර ව්‍යාපෘති ඇස්තමේන්තුව රු.මිලියන 5,505 ක් දක්වා වැඩි කර තිබුණු අතර

ව්‍යාපෘති කාලය 2016 වර්ෂය දක්වාද දීර්ඝ කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ සංශෝධනයන් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව මගින් ව්‍යාපෘතියේ සමස්ථ ඇස්තමේන්තුව රු.මිලියන 5,505 ක් ලෙස සංශෝධනය කර තවත් රු.මිලියන 400 ක් වූ ව්‍යාපෘති කාර්යයන් දෙකක් ඇතුළත් කර ව්‍යාපෘති කාලය 2017 වර්ෂය දක්වා දීර්ඝ කර තිබුණි. 2015 ජනවාරි 06 දින ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය මේ සඳහා ලබාගෙන තිබුණද, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) යථෝක්ත ව්‍යාපෘති කාර්යයන්ට යෝජනා ක්‍රම සකස් කිරීමේදී මුදල් රෙගුලාසි 3(ආ) ප්‍රකාර මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය හා 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 14 වගන්තිය ප්‍රකාර බලපත්‍ර ලබාගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඈ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව එක් එක් උපව්‍යාපෘතිවල අනුමත පිරිවැය වටිනාකම අනුව අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටු මගින් ප්‍රසම්පාදන කටයුතු ඉටුකළ යුතු වුවද, ඊට පටහැනිව අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවට යොමු කළ හැකි පරිදි උපව්‍යාපෘතිවල පිරිවැය කොටස් (පැකේජ) කර අමාත්‍යාංශය ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමැතිය ලබාදී තිබුණි.

(ඉ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණ ඇගයීම් කමිටු සඳහා දීමනා ගෙවීමේදී එක් ව්‍යාපෘතියක් තනි ප්‍රසම්පාදනයක් ලෙස සළකා දීමනා ගෙවීම වෙනුවට එක් එක් කොටස සඳහා වෙන වෙනම දීමනා ගෙවා තිබුණි. මෙම ව්‍යාපෘති කොටස් කර ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග ගැනීම අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කිරීම වැළැක්වීමට අමාත්‍යාංශය මගින් ගෙන තිබුණු ක්‍රියාමාර්ගයක් බැවින් එක් එක් කොටස් සඳහා වෙන වෙනම එකතුව රු.1,007,500ක ප්‍රසම්පාදන කමිටු දීමනා ගෙවීම මතභේදයට තුඩුදෙන්නක් විය. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව කමිටු දීමනා සඳහා සුදුසුකම් ලැබීමට නම් එකී ඇගැයීම් කාර්යයන් සාමාන්‍ය රාජකාරි වේලාවෙන් පරිබාහිරව සිදු කළ යුතු වුවත්, එසේ රාජකාරි වේලාවෙන් පරිබාහිරව ඇගැයීම් සිදු කළ බවට සාක්ෂි නොතිබුණි.

(ඊ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 1.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු අවම පිරිවැයක් යටතේ සිදුකළ යුතු වුවත්, ව්‍යාපෘතිය වෙනුවෙන් ඉන්වොයිස් වටිනාකම රු.4,401,403 ක් වූ Weigh Bridge කිරුම් යන්ත්‍ර 02 ක් රාජ්‍ය සමාගමක් මගින් ලබා ගැනීමට රු.5,501,754 ක් එම සමාගමට ගෙවා තිබුණි. ඒ අනුව විධිමත් අධිකාරි බලයක් රහිතව රු.1,100,351 ක් එම සමාගමට වැඩිපුර ගෙවා තිබුණි.

(උ) පානදුර ධීවර වරායේ මෝයකට ආශ්‍රිතව හා වරාය බේසමේ පිරෙන වැලි ඉවත් කිරීමට ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ දැනුම්දීමකට අනුව ව්‍යාපෘති අරමුදලින් රු.20,000,000 ක් ධීවර වරාය නීතිගත සංස්ථාවට අත්තිකාරමක් ලෙස 2014 ජූලි 30 දින ගෙවා තිබුණි.

(ඌ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘතියට නිලධාරීන් 18 දෙනෙකු අනුමත කර තිබුණද, ව්‍යාපෘතිය විසින් නිලධාරීන් 29 දෙදෙනෙකු බඳවා ගෙන තිබුණි. අනුමැතියකින් තොරව

බඳවාගත් නිලධාරී 11 කට වැටුප් හා දීමනා වශයෙන් 2014 අගෝස්තු මාසය වන විට එකතුව රු.2,485,675 ක් ගෙවා තිබුණි. ඒ අනුව මෙම බඳවා ගැනීම් හා වැටුප් ගෙවීම් විධිමත් අධිකාරි බලයකින් තොරව සිදුකර තිබුණි.

( එ ) කළමනාකරසේවා දෙපාර්තමේන්තුව ව්‍යාපෘතියට රියදුරන් 4 දෙනෙකු බඳවා ගැනීමට අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව පූර්ණකාලින රියදුරන් 4 දෙනෙකු සේවයේ යොදවා ගැනීමෙන් පසුව ධීවර වරාය නීතිගත සංස්ථාවේ රියදුරන් තිදෙනෙකු නිත්‍ය වැටුපෙන් 1/3 ක් බැගින් එකතුව රු.120,109 ක දීමනා 2014 අගෝස්තු මාසය දක්වා ගෙවා තිබුණි.

(ඒ) මුල්ගල් තැබීම ව්‍යාපෘතිවල සාමාන්‍ය කාර්යයක් වුවද කළමැටිය ධීවර වරාය, කයිකාවල හා පැරැලිය නැංගුරම්පල යන ව්‍යාපෘතිවල එම උත්සව වෙනුවෙන් වූ නර්තන කණ්ඩායම් 08 කට රු.512,650 ක්, වේදිකා සඳහා රු.523,500 ක්, දැන්වීම් පුවරු සහ පෝස්ටර් මුද්‍රණයට රු.565,500 ක් සහ බැලුම් සඳහා රු.157,000 ක් වශයෙන් එකතුව රු.1,758,650 ක වියදම් කර තිබුණි.

(ඔ) කළමැටිය ධීවර වරාය සහ කයිකාවල නැංගුරම්පල ඉදිකිරීමට මුල්ගල් තැබීමේ උත්සව වෙනුවෙන් සී/ස සීනෝර් පදනම මගින් ඉදිරිපත් කළ රු.1,200,000 ක ඇස්තමේන්තුව ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව අනුමත කර තිබුණු අතර ඒ සඳහා වියදම් වෙනුවෙන් එම සමාගමට ගෙවා තිබුණු මුදල රු.1,659,740 ක් විය. ඒ අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 මාර්ගෝපදේශය ප්‍රකාර අදාල අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව ඇස්තමේන්තු මුදල ඉක්මවා රු.459,740 ක් වැය කර තිබුණි.

(ඕ) 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.1 ඡේදය ප්‍රකාර වාර්ෂික කාර්යසාධන ඇගැයිමකට ලක්කිරීමෙන් අනතුරුව වැටුප් වර්ධක ලබා දිය යුතු වුවත්, එවැනි කාර්යසාධන ඇගයිමකින් තොරව 2014 නොවැම්බර් 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා නිලධාරීන් පස් දෙනෙකුට එකතුව රු. 16,605 ක වැටුප් වර්ධක ගෙවා තිබුණි.

(ක) 2007 දෙසැම්බර් 20 දිනැති අංක 33(1) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යාපෘතිවල සහායක කාර්ය මණ්ඩලයට රාජ්‍ය සේවයේ සමාන තනතුරුවල මූලික වැටුපට අමතරව සියයට 50 ක දීමනාවක් ලබාදිය හැකි වුවද, ව්‍යාපෘතියේ සහායක කාර්ය මණ්ඩලයට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව සියයට 50 ක දීමනාව මූලික වැටුපට එකතුකර ගෙවා තිබුණි.

(ග) අර්ධකාලීන පදනම මත සේවයේ නියුතු ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ ජීවන වියදම් දීමනාව ස්ථිර සේවා ස්ථානය වූ රාජ්‍ය සමාගමෙන් ලබාගත යුතු වුවත්, 2014 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා එකතුව රු.93,600 ක ජීවන වියදම් දීමනාව ව්‍යාපෘතියෙන් ගෙවා තිබුණි.

(ච ) ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 6.1 වගන්තිය ප්‍රකාරව අතිකාල පැයක් සඳහා ගෙවිය යුතු අනුපාතය මාසික වැටුපෙන් 1/240 ක් විය යුතු වුවත්, ඊට වැඩි අතිකාල අනුපාතයක් මත සේවකයින් 06 දෙනෙකුට අතිකාල දීමනා ගෙවීම හේතුවෙන් එකතුව රු.40,233 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඡ) ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ 4.1 වගන්තිය ප්‍රකාරව නිලධාරියෙකුට රාජකාරි කටයුතු සඳහා ගමනේ දුර ප්‍රමාණය සැතැපුම් 7 කට වඩා වැඩි වන විට, පැය 12 කට වැඩිකාලයක් රාජකාරි ස්ථානයෙන් පිටත ගතකිරීමට සිදුවුවහොත් ගෙවිය හැකි සංයුක්ත දීමනාව රු.500 ක් විය

යුතුව තිබුණි. නිලධාරීන් 04 දෙනෙකු විසින් අවස්ථා 06 කදී ආහාර හා නවාතැන් සඳහා දිනකට රු.500 ක් ඉක්මවා වැය කළ රු.104,523 ක් ව්‍යාපෘතිය විසින් ප්‍රතිපූර්ණය කර තිබුණි.

(ජ) කොළඹ සිට කරෙයිනගර් දක්වා ගොඩබිම් හා දුම්රිය මාර්ග ඔස්සේ යාමට පහසුකම් තිබියදී ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ 3.1 වගන්තියට පටහැනිව ව්‍යාපෘතියේ නිලධාරීන් දෙදෙනෙකු 2014 ජූලි 23 දින රත්මලාන සිට පලාලි දක්වා ගුවන් මගින් ගමන් කිරීමට පුද්ගලික ගුවන් සේවා ආයතනයකට රු.35,000 ක් ගෙවා තිබුණි.

(ඣ) ව්‍යාපෘතියේ අවශ්‍යතාවය මත සුළු මුදල් අග්‍රිමය ලෙස රු.20,000 ක් හා ඉන්ධන අග්‍රිමය වෙන්වෙන් රු.100,000 ක අත්තිකාරම් ගෙවා තිබුණත්, මුදල් රෙගුලාසි 371(අ) ප්‍රකාරව ඒ සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ත) සිලාවතුර, ගුරුනගර් සහ ගන්දර ධීවර වරායන් සංවර්ධනයට අදාල මූලික අධ්‍යයනය ව්‍යාපෘතිය සඳහා එම ප්‍රදේශවල ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් පර්යේෂණ, මූලික සැලැසුම් කිරීම හා ඇස්තමේන්තු පිළියෙල කිරිමට රු.මිලියන 90 ක් අනුමත කර තිබුණි.
මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(i). මෙම වරායන්වල මූලික සැලැසුම් හා ඇස්තමේන්තු සකස් කිරීමට අදාල කොන්ත්‍රාත්කාර සමාගම ඉදිරිපත් කර තිබුණු රු.මිලියන 159 ක ගාස්තුව ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර තිබුණි. ඇස්තමේන්තුගත පිරිවැය සියයට 77 කින් ඉක්මවා තිබුණත්, ඒ සම්බන්ධ හේතු නොදක්වා ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර තිබුණි.

(ii). මූලික අධ්‍යයනය සඳහා කොන්ත්‍රාත්තු පැවැරීමේදී කළින් එකඟ වූ ස්ථිර ගාස්තුවකට කාර්ය පැවැරීම සිදු කළ යුතු වුවත්, එසේ නොකර කොන්ත්‍රාත්කරු විසින්ම වරායන් 3 සඳහා සකස් කර තිබුණු එකතුව රු.මිලියන 18,221 ක පිරිවැය ඇස්තමේන්තුවලින් ප්‍රතිශත අගයක් ලෙස රු.මිලියන 159 ක ගාස්තු අනුමත කර තිබුණි.

(iii). රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 හා 3.3 මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රසිද්ධ ලංසු කැඳවීමක් කර නොතිබුණි. එමෙන්ම ලංසුකරුවන්ගේ පූර්ව සුදුසුකම් පරීක්ෂාවකින් තොරව කලින් තෝරාගනු ලැබූ සැපයුම්කරුවන් 04 දෙනෙකුට ලංසු ආරාධනා ෆැක්ස් මාර්ගයෙන් යවා තිබුණි. ඒ අනුව තෝරාගත් ලංසුකරු සමඟ විධිමත් ගිවිසුමක් මත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.1.4 මාර්ගෝපදේශය ප්‍රකාරව පවත්වාගත යුතු වාර්තාවද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iv). ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කමිටුව විසින්, අනපේක්ෂිත හා මිල ගණන් වෙනස්වීම සම්බන්ධයෙන් ඇතිවිය හැකි පිරිවැයද ඇතුළත් ඇස්තමේන්තු පදනම් කරගෙන ගණනය කළ උපදේශන ගාස්තු අනුමත කිරීම හේතුවෙන් අනාගතයේ ඇති විය හැකි අවිනිශ්චිත පරිවැයන් සඳහා රු.මිලියන 14.44 ක උපදේශන සේවා ගාස්තු ගෙවීමට සිදු වී තිබුණි.

(ද) කප්පරතොට නැංගුරම්පල ආශ්‍රිත ජැටිය ඉදිකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). ව්‍යාපෘතිය මගින් ඉටු කිරීමට අපේක්ෂිත කාර්යයන් නිශ්චය කරගෙන විස්තරාත්මක ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වුවත්, කප්පරතොට නැංගුරම්පල ආශ්‍රිතව ජැටිය ඉදිකිරීමට ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් වර්ග මීටරයක් රු.350,000 බැගින් සමස්ථ කාර්යයට රු.මිලියන 455 ක දළ ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණි.

(ii). ව්‍යාපෘතියේ මුල්ගල තැබීමේ උත්සවය පැවැත්වීමට පූර්ව අනුමැතීන් ලබාගැනීම හා ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව පිරිනැමීම සිදු කළ යුතු වුවද, එම කාර්යයන් ඉටුකිරීමට පෙර එනම් 2014 මාර්තු 15 දින මුල්ගල තැබීමේ උත්සවය පැවැත්වීමට රු.2,665,975 ක් වැය කර තිබුණි.

(iii). මුල්ගල තැබීමේ උත්සවය වෙනුවෙන් ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණු අතර ලංසු කැඳවීමකින් හා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියකින් තොරව සියළු කාර්යයන් පුද්ගලික ආයතනයකට පවරා තිබුණි. මෙම කාර්යය සඳහා එම පුද්ගලික ආයතනය වෙත රු.1,599,585 ක අත්තිකාරම් ගෙවා තිබුණි. එම පුද්ගලික ආයතනය විසින් ඉන්වොයිසියක් වෙනුවට බිල්පත් රහිතව ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර අත්තිකාරම් පියවා තිබුණි.

(iv). ජැටිය ඉදිකිරීම් ව්‍යාපෘතියේ මුල්ගල තැබීමේ කාර්ය ව්‍යාපෘතියේ සාමාන්‍ය කාර්යයක් වුවද, වියදම් ඇස්තමේන්තුව අනුව රු.මිලියන 2.7 ක් වැයකර උත්කර්ෂවත් උත්සවයක් ලෙස පැවැත්වීම හේතුවෙන් රාජ්‍ය මුදල් පරිහරණයේදී අරපිරිමැසුම්දායී හා නාස්තිය අවම වන ආකාරයට මෙහිදී කටයුතු කර නොතිබුණි.

(v). ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා 2014 ඔක්තෝබර් 23 දින කොන්ත්‍රාත් ආයතනය සමග ගිවිසුම් අත්සන් කර තිබුණද විගණිත දිනය වූ 2015 ජුලි 15 දින වන විටත් ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි.

(ධ) කළමැටිය ධීවර වරාය ඉදිකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). මෙම වරාය ඉදිකිරීම සඳහා ප්‍රසිද්ධ ලංසු කැඳවීමේ පුවත්පත් දැන්වීම අනුව ව්‍යාපෘතිය කොටස් (පැකේජ) 06 වශයෙන් නම් කර වෙන වෙනම ලංසු කැඳවා තිබුණි. මෙහිදී මිල ගණන් ඉදිරිපත් කළ ලංසුකරුවන් පස් දෙනෙකුගෙන් එක් සමාගමක් හැර අනෙකුත් සමාගම් පැකේජ 06 ට පැකේජයෙන් පැකේජයට වෙන් වෙන් වශයෙන් කොන්ත්‍රාත් ලෙස සළකා ලංසු ඉදිරිපත් කර තිබුණි. මේ නිසා එක් එක් ලංසුව සඳහා අදාළ ලංසුකරුවන් ප්‍රාරම්භක පිරිවැය (Preliminary Cost) එකතු කර තිබීම නිසා මුළු කොන්ත්‍රාත් පිරිවැය ඉහළ අගයක් ගෙන තිබුණි. පැකේජ වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් නොකළ ලංසුකරුගේ මුළු පිරිවැය ඇස්තමේන්තුව අනෙක් ලංසුකරුවන්ට වඩා අඩු අගයක් ගෙන තිබුණි. සියළුම ලංසුකරුවන්ට සමස්ථයක් ලෙස මිල ගණන් ඉදිරිපත් කරන ලෙස ලංසු ඉදිරිපත් කිරීමට පෙර සිදු කළ සාකච්ඡාවේදී (Pre Bid Meeting) දැණුවත් නොකිරීම නිසා එය මෙම ප්‍රසම්පාදනයේ විනිවිදභාවය කෙරෙහි බලපා තිබුණි.

(ii). ව්‍යාපෘතිය කොටස් 06 කොන්ත්‍රාත් 06 ක් ලෙස සළකා වෙන වෙනම මිල ගණන් ඉදිරිපත් නොකළ සමාගම කොන්ත්‍රාත්කරු ලෙස තෝරාගෙන තිබුණු අතර එම සමාගමද සමහර ප්‍රාරම්භක වියදම් පැකේජ 06 සඳහාම නැවත නැවත ඇතුළත් කර තිබීම නිසා ව්‍යාපෘති පිරිවැය වැඩිවී තිබුණි.

(iii). රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.14 හා 5.3.15 මාර්ගෝපදේශ අනුව ලංසු කැඳවීමේ කොන්දේසිවල සිදුකරනු ලබන වෙනස්කම් ලංසු ඉදිරිපත් කිරීමට අපේක්ෂිත සියළු පාර්ශවයන් දැනුවත් නොකිරීම නිසා නියමිත ලංසු බැඳුම්කර වටිනාකම ඉදිරිපත් නොකිරීම හේතුවෙන් කළමැටිය ධීවර වරායේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවට අවම මිල තෝරා නොගැනීමේ හේතුවෙන් රු.33,810,036 ක මූල්‍යමය අලාභයක් රජයට සිදුව තිබුණි. තවද මෙහිදී ප්‍රමාණපත්‍ර අයිතමයක් ඉවත්කිරීම සියළුම ලංසුකරුවන් දැනුවත්

නොකිරීම හේතුවෙන් අවම මිල ඉදිරිපත් කළ ලංසුකරුගේ ලංසුව ඇගයීමේදී එම අයිතමය ඉවත්කර ඇගයීමෙන් ලබාගත හැකිව තිබුණු රු.12,500,000 ක මූල්‍යමය ඉතිරිය රජයට අහිමිවී තිබුණි.

(iv). ව්‍යාපෘතියේ උපදේශක සමාගම පිළියෙල කළ ඉංජිනේරු ඇස්තමේන්තුවේ එක සමාන අයිතමවල එක් එක් පැකේජයට අදාළ අනුපාතයන්ගේ අසාමාන්‍ය විචලතා පැවතීම, සමහර අයිතම සඳහා කොන්ත්‍රාත්කරුවන්ගේ මිල ගණන් හා ඇස්තමේන්තුවේ මිල ගණන් අතර විශාල වෙනස්කම් පැවතීම යන හේතූන් නිසා ඇස්තමේන්තුව ප්‍රායෝගික තත්ත්වයෙන් බැහැර වී තිබුණි. දියකඩනයේ ගැඹුර අනුව වෙනස්විය යුතු ඒකක පිරිවැය අසාමාන්‍ය ලෙස විචලනය වී තිබුණි. ඉංජිනේරු ඇස්තමේන්තුව පිළියෙල කළ ආයතනය විසින් මුළු පිරිවැය කෙරෙහි පමණක් සැලැකිලිමත් වී ඇස්තමේන්තුව පිළියෙල කර තිබුණු බව නිරීක්ෂණය විය.

(v). ව්‍යාපෘතියේ ඉංජිනේරු ඇස්තමේන්තු අයිතම හා තෝරාගත් කොන්ත්‍රාත්කරුගේ ඇස්තමේන්තු අයිතම 67 ක වටිනාකම් අසාමාන්‍ය ලෙස සමාන වී තිබීම හේතුවෙන් ව්‍යාපෘති උපදේශක සමාගම සහ කොන්ත්‍රාත්කරු අතර සම්බන්ධතාවයක් ඇති බවට විගණනයේදී බැහැර කළ නොහැකි විය.

(vi). පැකේජ VI ට අදාල ජැටි බැම්ම, ප්‍රවිෂ්ය පාලම හා වෙරළ යටිතල පහසුකම් යන කාර්යයන්ට රු.29,948,360 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් 2014 ජූලි 17 දින ගෙවා තිබුණද 2015 මැයි 06 දින විගණනය මගින් භෞතිකව පරීක්ෂා කරන විටත් ඊට අදාල ඉදිකිරීම් කිසිවක් ආරම්භ කර නොතිබුණි. එසේ වුවද ඒ සඳහා රු.3,676,251 ක අතුරු ගෙවීමක් ගෙවා තිබීමත්, ඒ තුළ රු.2,662,072 ක අමතර වැඩ (Extra Works) ඇතුළත්ව තිබීමත්, මෙම ගෙවීම උපදේශක සමාගම නිර්දේශ කිරීමත් හේතුවෙන් එම සමාගමේ වගකීම නිසි පරිදි ඉටුකර නොමැති බව හා නොසැලකිලිමත්ව කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය විය.

(vii). ඉංජිනේරු ඇස්තමේන්තුවේද සඳහන් කර තිබු පරිදි කොන්ත්‍රාත්කරු විසින් කළමැටිය වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතියට වාහන 02 ක් සැපයීමට හා ඊට අදාල වියදම් ලබාදීමට එකග වී තිබුණි. එසේ සැපයු එක් වාහනයක් ව්‍යාපෘති අධ්‍යක්ෂගේ පරිහරණයට ලබාගෙන තිබීම හේතුවෙන් එම නිලධාරියාගේ ස්වාධීනත්වය අභියෝගයට ලක්ව තිබුණි. එසේ සැපයු වාහනය ව්‍යාපෘති අධ්‍යක්ෂ කලින් පරිහරණය කළ වාහනයම වු අතර මාස 09 ක කාලයට එම වාහනයේ ඉන්ධන වියදම රු.171,605 ක්ව තිබියදී කොන්ත්‍රාත්කරු වාහනය සැපයීමේදී මසකට රු.165,000 ක් බැගින් ඉන්ධන වියදම ඇස්තමේන්තු කර බිල්පත් වලට එකතු කිරීම නිසා සත්‍ය වියදමට වඩා අට ගුණයකට වැඩි වියදමක් ව්‍යාපෘතියට දැරීමට සිදුව තිබුණි.

(viii). 2014 දෙසැම්බර් 08 දින සිට ව්‍යාපෘතිය මගින් පත්කළ වැඩබිම් ඉංජිනේරුවරයකුට කොන්ත්‍රාත්කරු මාසිකව රු.100,000 ක් බැගින් වූ වැටුපක් ගෙවා එම වැටුප බිල්පත්වලට ඇතුළත් කර ව්‍යාපෘතියෙන් ලබාගැනීමට කටයුතු කර තිබුණි. මෙසේ ව්‍යාපෘතිය පත්කළ ඉංජිනේරුවරයාගේ වැටුප කොන්ත්‍රාත්කරු ලවා ගෙවීමට සැලැස්වීමෙන් ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ ස්වාධීනත්වය මතභේදයට ලක්ව තිබුණි. මෙම ඉංජිනේරු බඳවා ගැනීම හා ඔහුගේ වැටුප 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමණාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව ගෙවා නොතිබුණි.

(ix). කොන්ත්‍රාත්කරු විසින් නේවාසික ඉංජිනේරු හා සේවායෝජක කාර්ය මණ්ඩල වෙනුවෙන් කාර්යාල ඉඩපහසුකම් හා කාර්යාල උපකරණද, නවාතැන් පහසුකම් හා ගෘහභාණ්ඩද, අනෙකුත් පහසුකම්ද, සපයා තිබූ නමුත් 2015 මැයි 06 දින වන විට එම වත්කම්වලින් සමහර වත්කම් නිෂ්කාර්යව සහ සමහරක් ඌන උපයෝජිතව පැවැතියද, කොන්ත්‍රාත්කරුට ඒ සඳහා ගෙවීම් කර තිබුණි.

(x). ව්‍යාපෘතියේ ගොඩනැගිලි ඉදිකිරිමට අපේක්ෂා කළ පෞද්ගලික ඉඩම අංක 1879/9 දරන ගැසට් නිවේදනය මගින් රජය විසින් 2014 සැප්තැම්බර් 11 දින පවරා ගෙන තිබුණද,ඒ සඳහා වන්දි ලබාදීමට 2015 ජුලි 15 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(න) මරදාන නැංගුරම්පල ඉදිකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.2.1 හා 2.4.1 මාර්ගෝපදේශවලට සහ 2013 සැප්තැම්බර් 05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව තරඟකාරි ලංසු කැඳවීමකින් තොරව මරදාන නැංගුරම්පල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.මිලියන 200 කට රාජ්‍ය සමාගමකට 2013 ඔක්තෝබර් 23 දින පවරා තිබුණි.

(ii). සෘජු කොන්ත්‍රාත් පිරිනැමීමේදී අදාළ සමාගමේ ශාක්‍යතාවය පිළිබඳ ප්‍රසම්පාදන කමිටුව සෑහීමකට පත්විය යුතු වුවද, ධීවර ආම්පන්න සහ බෝට්ටු නිෂ්පාදනය සහ අලෙවිය සඳහා පිහිටුවා තිබුණු රාජ්‍ය සමාගමට ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක් පැවරීමට ප්‍රසම්පාදන කමිටුව අනුමත කිරීම මතභේදයට තුඩුදෙන්නක් විය. කෙසේ වුවද එම සමාගම අමාත්‍යාංශය සමග එළඹ තිබුණු ගිවිසුම උල්ලංඝනය කරමින් කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් කටයුතු රු.62,000,000 කට උපකොන්ත්‍රාත්කරුවෙකු වෙත ලබාදී තිබුණි.

(iii). කොන්ත්‍රාත්තුව සඳහා ලංසු කැඳවීමට පෙර විස්තරාත්මක පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කළ යුතු වුවත්, ප්‍රසම්පාදන අස්ථිත්වය ඒ සඳහා පියවර ගෙන නොතිබුණු අතර එම ඇස්තමේන්තුව කොන්ත්‍රාත්කරු විසින්ම පිළියෙල කර තිබුණි.

(iv). අදාල කොන්ත්‍රාත්තුවේ සුපරීක්ෂණය හා පරිපාලනය යන කාර්යයන් රාජ්‍ය සමාගමට පිරිනමා තිබියදී ඉන් මාස 10 කට පසු කොන්ත්‍රාත්තුවේ සුපරීක්ෂණය හා පරිපාලනය සඳහා උපදේශක ආයතනයක් පත් කිරීමටත් ඒ සඳහා රු.5,248,886 ක් ගෙවීමටත් ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව අනුමත කර තිබීම මතභේදයට තුඩුදෙන්නක් විය. මෙහිදී ප්‍රසම්පාදන කමිටුව උපදේශක ආයතනය පත්කිරීම අනුමත කිරීමට පෙර අමාත්‍යාංශය අදාල ආයතනය සමඟ ගිවිසුමකට එළඹ තිබුණු බවද වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(v). ව්‍යාපෘතිය සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 5.4.4(1) මාර්ගෝපදේශයට පටහැනිව එම සමාගම වෙත අත්තිකාරම් සුරක්ෂණයක් රහිතව රු.40,000,000 ක අත්තිකාරම් ලබාදී තිබුණු අතර කොන්ත්‍රාත් පිරිනැමීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 5.4.8 මාර්ගෝපදේශය ප්‍රකාර කාර්යසාධන සුරක්ෂණද ලබාගෙන නොතිබුණි.

(ප) මීගමු කලපු සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). මීගමු කලපු සංවර්ධන ව්‍යාපෘතියේ මූලික කාර්යයන් සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමෙන් හා තරඟකාරි ලංසු කැඳවීමකින් තොරව රජයේ

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.3 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවට පවරාදීමට ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා 2014 දෙසැම්බර් 24 දින අනුමැතිය ලබාදී තිබුණි.

(ii). මුළු පිරිවැය ඇස්තමේන්තුව සකස් කර අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගැනීම වෙනුවට එම මුළු පිරිවැය ඇස්තමේන්තුව උපකොටස් කීපයකින් යුතුව වරින්වර පිළියෙල කර අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කර අනුමැතිය ලබාගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය කර තිබුණි. මූලික කාර්යයන් වෙනුවෙන් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් ඉදිරිපත් කළ රු.මිලියන 99 ක ඇස්තමේන්තුව අනුව එම සංස්ථාවට කොන්ත්‍රාත්තුව පිරිනැමීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(iii). කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹීමට කටයුතු නොකර පසුව අදාල කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 99.997 කට සංශෝධනය කර ඇස්තමේන්තුවක් සංස්ථාව විසින් ඉදිරිපත් කර තිබුණි.

(iv). අදාල ඇස්තමේන්තුවේ මුල්ගල තැබීමේ හා ඒ ආශ්‍රිත කාර්යයන්ට ඇස්තමේන්තු කළ රු.මිලියන 5 ක වටිනාකම අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය මත ධීවර වරාය නීතිගත සංස්ථාවේ සභාපතිට ගෙවා තිබුණි. එම මුදල සංස්ථාවේ සභාපති විසින් මීගමු කලපු ව්‍යාපෘතියේ ආරම්භක උත්සවය වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට අත්තිකාරම් වශයෙන් ලබාදී තිබුණි. අදාල ආයතනය ලංසු කැඳවීමකින් තෝරාගෙන නොතිබුණු අතර එම ආයතනය ඉදිරිපත් කළ රු.8,950,000 ක ඇස්තමේන්තුව විවෘත කිරීමේ උත්සවයට අදාල වුවත් එක් එක් අයිතමය සඳහා පිරිවැය වෙන් වෙන්ව දක්වා නොතිබුණි.

(v). ව්‍යාපෘතියේ ආරම්භක උත්සවයට ලබා දුන් රු.මිලියන 5 ක අත්තිකාරම 2015 අගෝස්තු 15 දින වන විටත් නිරවුල් කර නොතිබුණු අතර, ව්‍යාපෘති කාර්යයද ආරම්භ කර නොතිබුණි.

(vi). කලපුව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා මුල්ගල තැබීම සාමාන්‍ය කාර්යයක් වුවද, ඉදිරිපත් කළ රු.මිලියන 8.9 ක ඇස්තමේන්තුව අනුව එය රාජ්‍ය මුදල් අරපිරිමැසුම්දායක ලෙස පරිහරණය වන ආකාරයට පිළියෙල කර නොතිබුණි.

(vii). මෙම ව්‍යාපෘතිය යටතේ සම්බන්ධීකරණ කාර්යාලයක් පිහිටුවීමට ඇස්තමේන්තු කර නොතිබියදී ව්‍යාපෘති අධ්‍යක්ෂගේ අනුමැතිය මත රු.574,080 ක් වැයකර සම්බන්ධීකරණ කාර්යාලයට කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණි. එම කාර්යාලය 2015 මාර්තු 31 දින වසා දමා තිබුණි. ඒ අනුව මිලදී ගත් වත්කම් අනුමැතියකින් තොරව ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවට ලබා දී තිබුණි.

(viii). ව්‍යාපෘතියට අදාල ක්ෂේත්‍ර චාරිකාවකට 2014 ජුලි 18 දින 103 දෙනෙකුට ආහාරපාන ලබාගැනීම වෙනුවෙන් මීගමුව ප්‍රදේශයේ උත්සව ශාලාවකට රු.103,600 ක් ගෙවා තිබුණි. එම ගෙවීම සඳහා පූර්ව අනුමැතියක් ලබාගෙන නොතිබුණු අතර එම පිරිස නිරීක්ෂණ චාරිකාවට සහභාගී කර ගැනීම හා ඔවුන්ගේ සංග්‍රහ වෙනුවෙන් කර තිබුණු වියදම අනාර්ථික වියදමක් වී තිබුණි.

**(ඔ)** කයිකාවල නැංගුරම්පල ඉදිකිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). මෙම ව්‍යාපෘතියට උපදේශක ආයතනය තෝරා ගැනීමේදී සුදුසුකම් සැපුරා තිබුණු අවම මිල ඉදිරිපත් කළ ආයතනය තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර තිබුණද, එම නිර්දේශය නොසළකා ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව ඊට වැඩි ලංසුවක් ඉදිරිපත් කළ ආයතනයක් අනුමත කිරීම නිසා රජයට රු.1,583,000 ක මූල්‍ය අලාභයක් සිදු වී තිබුණි. එම තෝරාගත් ආයතනයේ කාර්ය මණ්ඩල ප්‍රවීණත්වය මෙම තෝරාගැනීමට හේතු ලෙස දක්වා තිබුණද, එම ආයතනය ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් රහිතව මරදාන, පැරුලිය, කප්පරතොට, කළමැටිය යන ධීවර වරායවල් හා නැංගුරම්පලවල් ඉදිකිරීමේ උපදේශක ආයතනය ලෙස ක්‍රියාකරමින් පැවතුණි.

(ii). මෙම නැංගුරම්පල ඉදිකිරීමේ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් වටිනාකම රු.245,800,810 ක් වූ අතර එය රු.245,170,850 ක ඉංජිනේරු ඇස්තමේන්තුව රු.629,960 කින් ඉක්මවා තිබුණි.

(iii). නැංගුරම්පල ඉදිකිරීමට කොන්ත්‍රාත්කරු තෝරාගැනීමට පුවත්පත් දැන්වීමක් මගින් ලංසු කැඳවා තිබුණු අතර ලැබී තිබුණු ලංසු සළකා බැලීමට අවශ්‍ය පූර්ව සුදුසුකමක් ලෙස සාගර ඉදිකිරීම් රු.මිලියන 700 ක් ඉක්මවා සිදුකර තිබිය යුතු බවට කොන්දේසි ඇතුළත් කර පසුව ව්‍යාපෘති අධ්‍යක්ෂක විසින් මෙම සාගර ඉදිකිරීම් පිරිවැය සීමාව රු.මිලියන 500 දක්වා සංශෝධනය කර තිබුණද, එම සංශෝධනය ප්‍රසිද්ධ කර නොතිබුණි. මේ හේතුවෙන් ලංසුකරුවන් දෙදෙනෙකු පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. මෙහිදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2(ඇ) මාර්ගෝපදේශය ප්‍රකාර සාධාරණ හා සමාන උපරිම අවස්ථා ඊට උනන්දුවක් දක්වන පාර්ශවවලට ලබාදිය යුතුය යන කොන්දේසිය අනුව කටයුතු කර නොතිබුණි.

(iv). උපදේශක සමාගම ඉංජිනේරු ඇස්තමේන්තුව පිළියෙල කිරීමේදී ව්‍යාපෘතිය පැකේජ 02 කට බෙදා තිබූ අතර පැකේජ I හා II සඳහා ප්‍රාරම්භක පිරිවැය පිළිවෙලින් රු.24,643,000 ක් හා රු.21,768,000 ක් විය. එහිදී ප්‍රාරම්භක වියදම් ප්‍රමාණ පත්‍ර අයිතම 40 කින් අයිතම 04 ක් හැර අනෙකුත් අයිතම 36 ක් සඳහා පැකේජ 02 හි සමානව පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කර තිබුණු අතර එහිදී ප්‍රාරම්භක වියදම දෙවරක් ඇතුළත්වීම හේතුවෙන් පිරිවැය අධිගණනයක් වී තිබුණි.

(v). පැකේජ I හා II සඳහා දියකඩනයේ දිග පිළිවෙලින් දම්වැල් 800 හා දම්වැල් 700 ක් වී තිබියදී ඉංජිනේරු ඇස්තමේන්තුවේ බිල් අංක 02 යටතේ වූ Dredging Excavation and Earth work හි දක්වා තිබූ ප්‍රමාණපත්‍ර අයිතමවල ඒකක ප්‍රමාණයන් හා පිරිවැය අසාමාන්‍ය ලෙස සමානව දක්වා තිබුණි.

(vi). ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් 2014 දෙසැම්බර් 29 දින සිට අත්හිටුවා තිබීමෙන් ව්‍යාපෘති ගිවිසුමේ 8.8 වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් පරිශ්‍රයේ රඳවා තිබුණු යන්ත්‍ර සූත්‍ර, ශ්‍රමය හා වාහන යනාදිය සඳහා 2015 ජනවාරි මාසයේ සිට අප්‍රේල් මාසය දක්වා කාලයට රු.27,440,142 ක ( එකතු කළ අගය මත බදු රහිත) බිල්පත් ඉදිරිපත් කර තිබුණි.

(vii).

(viii). කයිකාවල නැංගුරම්පලේ සමාරම්භය සටහන් කළ කළුගල් ස්මාරකය සාදා නියමිත ස්ථානයේ සවිකිරීමේ වියදම රු.47,500 ක්ව තිබියදී, කළමැටිය ධීවර වරායේ පිහිටි කළුගලක් මත සමරු ඵලකයක් සකස් කිරීමට රු.200,000 ක් වැය කර තිබීම අනාර්ථික වියදමක් වී තිබුණි.

(භ) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේ වාර්තා 2015 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද ව්‍යාපෘතිය විසින් විගණිත දිනවූ 2015 අගෝස්තු 15 දක්වාම 2014 වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණය සිදු කර නොතිබුණි.

**3.10.2 දික්ඕවිට ධීවර වරාය ව්‍යාපෘතිය**

**----------------------------------**

මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 ජුලි මස 11 දිනැති අංක අමා/14/0749/532/00/-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ධීවර වරාය, නැංගුරම්පල සහ තොටුපල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට 2014 අයවැය ඇස්තමේන්තුවෙන් වෙන්කළ රු.මිලියන 2,000 ක ප්‍රතිපාදනයෙන් දික්ඕවිට ධීවර වරායේ ඉතිරි වැඩ නිම කිරීමට රු.මිලියන 128 ක් වෙන්කර තිබුණත් රු.මිලියන 80 ක් මෙම ව්‍යාපෘතිය මගින් උපයෝජනය කර තිබීමෙන් වෙන්කළ මුදලින් රු.මිලියන 48 ක් එනම් සියයට 37.5 ක් භාවිතා කර නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට යථෝක්ත ව්‍යාපෘතියෙන් රු.201,260,414ක් වටිනා ස්ථාවර වත්කම් අත්පත් කර ගෙන තිබුණු අතර ව්‍යාපෘති ඉදිකිරීම් පිරිවැය රු.8,229,278,640 ක් විය. වරායේ ඉදිකිරීම් නිමකිරීමෙන් අනතුරුව එහි මෙහෙයුම් කටයුතු සඳහා ධීවර වරාය නීතිගත සංස්ථාවට ලබාදී තිබුණද වරාය හා එහි වත්කම් නීත්‍යානුකූලව පැවරීමට 2015 අගෝස්තු 15 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) ව්‍යාපෘතියේ ස්ථාවර වත්කම් ලේඛනය අනුව රු.57,254,733 ක වත්කම් සී/ස සීනෝර් පදනමේ හා රු.4,493,774 ක වත්කම් ධීවර වරාය නීතිගත සංස්ථාව භාරයේද පැවතුණි. තවද ව්‍යාපෘතියෙන් මිලදී ගෙන තිබුණු එකක් රු.7,695,902 ක් වූ ඩබල් කැබ් රථ 5න් දෙකක් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවටද, එක් රථය බැගින් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවට, සී/ස සීනෝර් පදනමට හා ධීවර වරාය නැංගුරම්පල සංවර්ධන ව්‍යාපෘතියේ කාර්යාලයට ව්‍යාපෘතිය විසින් සෘජුවම භාර දී තිබුණි. එම වාහන ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා මගින් භාරදීමට කටයුතු කර නොතිබුණු අතර, ඒ වෙනුවෙන් නිකුත් කිරීම් නියෝග හෝ භාණ්ඩ ලැබීමේ තුණ්ඩු හෝ භාරගත් බවට වෙනත් ලියවිල්ලක් හෝ අදාළ ආයතන වෙතින් ලබා ගෙන නොතිබුණි.

(ඈ) දික්ඕවිට ධීවර වරාය ඉදිකිරීමේ ව්‍යාපෘති තුළින් බෝට්ටු නිර්මාණය කිරිමේ කාර්ය පැවැරි නොතිබුණි. නමුත් ව්‍යාපාතිය විසින් බෝට්ටු නිර්මාණය කිරීමේ පරිගණක මෘදුකාංග බලපත්‍රයක් 2014 අප්‍රේල් 30 දින රු.9,664,584 කට මිලදී ගෙන තිබුණි. එම පරිගණක මෘදුකාංගයේ ගැනුම්කරු ලෙස සී/ස සීනෝර් පදනම සඳහන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i). 2011 නොවැම්බර් 09 දිනැති ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව ස්ටර්ලින් පවුම් 42,250කට (රු.7,520,500) මෘදුකාංගය මිලදී ගැනීමට අනුමත කළද නැවත එම කමිටුව 2014 මැයි 17 දින නව මිල කැඳවීමක් සිදුකර මෘදුකාංගයේ ප්‍රයෝජනවත්භාවය වැඩි වී තිබුණු බව සඳහන් කරමින් ස්ටර්ලින් පවුම් 44,225 කට (රු.9,243,025) මෘදුකාංගය මිලදී ගැනීමට අනුමත කර තිබීම නිසා රු.1,722,525 ක් වැඩිපුර ගෙවීමට අනුමැතිය ලබා දී තිබුණි.

(ii). මෙම මෘදුකාංග බලපත්‍ර ගිවිසුම 2013 ජනවාරි 07 දින අත්සන් කර තිබුණු බැවින් විගණිත දින වනවිට මිලදී ගෙන වසර දෙකකුත් මාස 06 ක කාලයක් ඉකුත්ව තිබුණද එම කාලය තුළ මෙම මෘදුකාංගය ප්‍රයෝජනයට ගෙන නොමැති බැවින් නිෂ්කාර්ය වත්කමක් බවට පත්ව තිබුණි. තවද ගිවිසුම අනුව බලපත්‍ර කාලය 2018 ජනවාරි 07 දින අවසන් විමට නියමිතව තිබුණි.

(ඉ) දික්ඕවිට ධීවර වරාය ව්‍යාපෘතියේ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 180 ක් වැයකර සී/ස සීනෝර් පදනමේ මට්ටක්කුලිය බෝට්ටු අංගනය අළුත්වැඩියා කිරිමේ වියදම පියවීමේ ක්‍රමයක් ලෙස ධීවරයන්ට සහන මිලට බෝට්ටු හා යාත්‍රා අළුත්වැඩියා කර දීමට එකඟ වී තිබුණි. ඒ සඳහා යෝජනා ක්‍රමයක් සකස් කරන ලෙස 2013 ජනවාරි 13 දින පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම්කාරක සභාව විසින් නියෝග කර තිබුණද, එවැනි යෝජනා ක්‍රමයක් විගණන දිනය වු 2015 අගෝස්තු 15 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

**3.10.3 ව්‍යාපෘති ආරම්භ නොකර අතහැර දැමීම**

-----------------------------------------------

උම්බලකඩ නිෂ්පාදනය තුළින් අපතේ යන උම්බලකඩවලින් නිෂ්පාදනයක් වූ පෝෂ්‍යදායි රියහකුරු නිෂ්පාදනයට දැනුම ලබාගැනීමට රු.2,150,000 ක ප්‍රතිපාදන අමාත්‍යාංශය වෙත සළසා තිබුණද එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකර අත්හැර තිබුණි.

**3.10.4 මුදල් නිදහස් කර තිබුණද ප්‍රගතියක් ලබා නොතිබු ව්‍යාපෘති**

-----------------------------------------------------------------

අමාත්‍යාංශය විසින් සමහර ව්‍යාපෘති සඳහා මුදල් නිදහස් කර තිබුණත්, එම ව්‍යාපෘතිවලින් සාර්ථක ප්‍රගතියක් ලබා ගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාළු සුප් කැට නිෂ්පාදනය කිරීම සඳහා රු.500,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් රු.400,000 ක් උපයෝජනය කර සුප් කැට නිපදවා තිබුණි. නමුත් 2015 ජුලි මාසය වන විටද එය වෙළඳපලට හඳුන්වා දී ව්‍යාප්ත කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) යාපනය තැපැල් කඬේ මංසන්ධියේ රු.1,700,000 ක් ඇස්තමේන්තු ගත වටිනාකමකට මත්ස්‍ය අලෙවි සැලක් ඉදිකිරීමට ලංකා ධීවර සංස්ථාවට 2014 පෙබරවාරි 17 දින අවසර ලබාදී තිබුණි. 2014 දෙසැම්බර් 31 දින වන විටත් අපේක්ෂිත ඉලක්කයන් සපුරාගැනීමට අපොහොසත් වී තිබුණු අතර එදිනට එම කාර්යේ ප්‍රගතිය සියයට 25 ක් පමණ වී තිබුණි.

(ඇ) ගම්පහ දිස්ත්‍රික්කයේ සීදුව, මුකලන්ගමුව, මැල්වත්ත සුහද කාන්තා ධීවර සමිතියේ ප්‍රජා ශාලාව ඉදිකිරීමට රු.250,000 ක් ඇස්තමේන්තු කර අදාල මුදල ගම්පහ දිස්ත්‍රික් ලේකම්ට මුදාහැර තිබුණු නමුත් 2014 දෙසැම්බර් 31 දිනට එහි භෞතික කාර්යසාධනය සියයට 50 ක් පමණ වී තිබුණි.

**(ඈ)** මව් යාත්‍රා 02 ක් රු.326,016,000 කට මිලදී ගැනීමට 2007 වර්ෂයේදි අමාත්‍යාංශය විදේශීය සැපයුම්කරුවෙකු සමග ගිවිසුමකට එළඹ 2015 අගෝස්තු 31 දින වන විට ඒ සඳහා රු.113,556,801 ක් ගෙවා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ගැඹුරු මුහුදේ මත්ස්‍ය සම්පත මරුවැල්පන්න ක්‍රමය උපයෝගී කර ගනිමින් නෙළා ගැනීම සඳහා සහ බහුදින ධීවර යාත්‍රා සඳහා අවශ්‍ය ගැනියන්, ඉන්ධන, ආහාර ද්‍රව්‍ය, අයිස්, නෙලා ගත් මත්ස්‍ය සම්පත නෂ්‍ය නොවී ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය ශීතාගාර පහසුකම්ද සමග මව් යාත්‍රා දෙකක් සැපයීම අරමුණු කර ආරම්භ කරන ලද ව්‍යාපෘතිය ආරම්භ කර වසර 09 ක් ගතවී තිබුණද, එකී අරමුණ ඉටුකිරීමට විගණිත දිනය වූ 2015 අගෝස්තු 31 දින වන විටත් අමාත්‍යාංශය අසමත්වී තිබුණි.

(ii) තවද මෙම ව්‍යාපෘතියට 2006 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වාර්ෂිකව ප්‍රතිපාදන සළසා තිබුණද, එම ප්‍රතිපාදනවලින් රු.541,018,038 ක් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි. 2013 අගෝස්තු 22 දිනැති අංක 13/1103/532/011 දරන අමාත්‍ය මණ්ඩල තීරණයෙන් පවත්නා සම්පත් ඵලදායී අයුරින් භාවිතයට ගැනෙන බවට තහවුරු කරන ලෙසත් කාර්ය සම්බන්ධයෙන් දැඩි අධීක්ෂණයක් සිදුකළ යුතු බව අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අවධානයට යොමු කර තිබුණි.

(iii) 2013 ඔක්තෝබර් 31 දින යාත්‍රා සැපයීම සම්බන්ධයෙන් සැපයුම්කරු සමග එළඹී නව ගිවිසුම අනුව ණයවර ලිපිය විවෘත කර මාස 09 ක් ඇතුළත මව් යාත්‍රා 02 නිමකර භාරදීමට එකඟ වී තිබුණි. 2015 අගෝස්තු 15 දින වන විටත් එම ධීවර යාත්‍රා භාරදී නොතිබුණු අතර භාරදීමේ ප්‍රමාදය සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව ගිවිසුමේ කොන්දේසි ඇතුළත්ව කර නොතිබීම හේතුවෙන් ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබුණි.

(iv) යාත්‍රා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තාක්ෂණික පිරිවිතරයන් සංවර්ධනය කිරීම හා උපදේශක සේවා සැපයීමට රාජ්‍ය සමාගමක් සමග ගිවිසුමකට එළඹ තිබුණු අතර, ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.1,544,726 ක් ගෙවා තිබුණි. එම ගෙවීම සඳහා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියක් ලබා ගෙන නොතිබුණු අතර තාක්ෂණික පිරිවිතර ඇතුළත් කිසිදු වාර්තාවක් 2015 අගෝස්තු 15 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

(v) විගණිත දිනය වූ 2015 අගෝස්තු 15 දින වන විටත් යාත්‍රා මිලදී ගැනීමේ කාර්ය ඉටු කර නොතිබුණු නිසා මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් වැය කළ රු.113,556,801 ක මුදල රජයට සිදුවූ මූල්‍යමය පාඩුවක් ලෙස නිරීක්ෂණය විය.

### 3.10.5 භාණ්ඩ හා සේවා සැපයීම් රහිතව මුදල් නිදහස් කිරීම

---------------------------------------------------------

2014 දෙසැම්බර් 20 දිනට ප්‍රථම රු.16,523.074 ක් වටිනා ධීවර ඔරු හා කොල්ලෑ 203 ක් හා ධිවර දැල් කට්ටල 1,585 ක් ජලජීවී වගා සංවර්ධන අධිකාරියට සැපයීමට ඇණවුම් ලබා තිබුණි. සැපයුම්කරු විසින් 2014 දෙසැම්බර් 31 දින වන විට රු.8,005,588 ක් වටිනා භාණ්ඩ අමාත්‍යාංශය වෙත භාර දි තිබුණි. එම සපයා තිබුණු භාණ්ඩ අදාළ පිරිවිතරයන්ට අනුකූලව නිෂ්පාදනය කර තිබුණු බවට, භාණ්ඩ උපාංග සහිතව නිවැරදිව ලැබුණු බවට හා ඒම භාණ්ඩ පොත්පත්වල ඇතුළත් කළ බවට තහවුරුවක් ලබා නොගෙන අමාත්‍යාංශය විසින් රු.14,079,500 ක් සැපයුම්කරුට ගෙවා තිබුණි. 2014 මූල්‍ය සැලැස්ම අනුව රු.16,523,074 ක් පිරිවැය වූ මිරිදිය ධීවර යෙදවුම්, දිස්ත්‍රික්ක 11 ක බෙදැහැරීමට එකඟ වී තිබුණද, විගණිත දිනය වූ 2015 අගෝස්තු 15 දින වන විටත් දිස්ත්‍රික්ක 10 කට ඒවා බෙදාදී නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි.

**3.11 කාර්යසාධනය**

-----------------

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) වෙරළ පුනරුත්ථාපන හා සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රු.43,810,000 ක ප්‍රතිපාදන ප්‍රතිශෝධිත අයවැය මගින් සළසා තිබුණි. එම ප්‍රතිපාදනවලින් එම ව්‍යාපෘතියේ අරමුණුවලට පටහැනිව ධීවර ආම්පන්න මිලදි ගැනිම, ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ පරිපාලන වියදම් හා වෙනත් වැය විෂයයන්ට ප්‍රතිපාදන මාරු කිරිම් සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.40,119,509 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් අපේක්ෂිත කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණේ සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 8.4 ක ප්‍රමාණයක් පමණි.

(ආ) කුරුණෑගල, පුත්තලම, කෑගල්ල යන දිස්ත්‍රික්කවල ධීවර ප්‍රජාව සඳහා උපකරණ මිලදී ගැනීම හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට දැයට කිරුළ සංවර්ධන වැඩසටහන යටතේ රු.15,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. එම ප්‍රතිපාදනවලින් රු.5,040,000 ක් 2014 දැයට කිරුළ වැඩසටහන යටතේ වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ලංකා ධීවර සංස්ථාවට ලබාදී තිබුණි. මෙහිදී අදාල දිස්ත්‍රික්කවල ධීවර ප්‍රජාවගේ උන්නතිය වෙනුවෙන් වූ යෝජිත ඉලක්ක ලගා කර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබූ අතර දැයට කිරුළ සංවර්ධන වැඩසටහනේ ධීවර අංශයේ ප්‍රගතිය සියයට 60.2 ක් පමණක් විය.

(ඇ) දැයට කිරුළ සංවර්ධන වැඩ සටහන යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබුණු මත්ස්‍ය වෙළඳපලකට විදුලිය සැපයීම හා පිවිසුම් මාර්ගයක් ඉදිකිරීම යන සංවර්ධන කාර්යයන්ට රු.150,000 ක් වැයකළ බව සඳහන් කර තිබුණද, 2014 වර්ෂයේ ප්‍රගති වාර්තාවේ එහි මූල්‍ය හා භෞතික කාර්යසාධනයේ ප්‍රගතිය ඇතුළත්ව නොතිබුණි.

(ඈ) ඉරනම ජලජීවී වගා ව්‍යාපෘති කර්යාලය ඉදිකිරීමට සඳහා රු.225,000,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද, එහි වියදම රු.169,707,103 ක් වීමෙන් අදාල කාර්යයේ මූල්‍ය කාර්සාධනය සියයට 75 ක් විය.

(ඉ) ධීවර ප්‍රජාව ශක්තිමත් කිරීම යටතේ ධීවර ආම්පන්න මිලදී ගැනීම සඳහා රාජ්‍ය සමාගමකට රු.මිලියන 48.92 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබුණද, අදාළ කාර්යයන් ඉටුකර නොතිබුණු අතර භෞතික කාර්යසාධනය පිළිබඳ තොරතුරු 2014 වර්ෂයේ කාර්යසාධන වාර්තාවේ ඇතුළත් කර නොතිබුණි.

(ඊ) ධීවර ප්‍රජාව ශක්තිමත් කිරීම විෂයය යටතේ ඇස්තමේන්තුගත ව්‍යාපෘති 12 කට මුදාහළ රු.මිලියන 20.01 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රගතිය හෝ භෞතික ප්‍රගතිය, 2014 වර්ෂයේ කාර්යසාධන වාර්තාවේ දක්වා නොතිබුණි.

(උ) උතුරු පළාත සඳහා මුහුදු පතුලේ එලන ධීවර දැල් වෙනුවට විකල්ප දැල් ආම්පන්න ලබාදීම සඳහා රු.මිලියන 16.85 ක් ලබා දී තිබුණද, එම කාර්යයේ භෞතික කාර්යසාධනය සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.12 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**
**-----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) අක්‍රීය බැංකු ගිණුම්**
**----------------------**

අමාත්‍යාංශය විසින් පවත්වා ගෙන ගිය ජංගම ගිණුම් 04 කින් ජංගම ගිණුම් 03 ක 2014 දෙසැම්බර් 31 දින වන විට ශූන්‍ය ශේෂයන් තිබුණු අතර, එක් ජංගම ගිණුමක වර්ෂ 5 මාස 6 ක කාලයක සිට රු.28,618 ක වාසිදායක ශේෂයක් අක්‍රියව පැවැතුණි.

**(ආ) ශේෂ සනාථ නොකිරීම**
**---------------------------**

2014 දෙසැම්බර් 31 දින වන විට බැංකු ගිණුම් 05 කට අදාළව එකතුව රු.140,774,386 ක ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.14 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**
**--------------------------------------**

ජාතික ධීවර මහා සම්මේලනය නමින් 2013 ජුනි 12 දින පිහිටුවා තිබුණු පොදු සමාගමකට වියදම් සඳහා අමාත්‍යාංශය විසින් රු.3,188,188 ක් සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබුණි.

**3.15 අවිධිමත් ගනුදෙනු**
**-----------------------**

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු විධිමත් බවින් තොර වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

**(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාපටිපාටියෙන් බැහැරවීම**
**------------------------------------------------------------------------**

**(i) ආපනශාලාව පවත්වා ගැනීමට ආයතනයක් තෝරාගැනීම**
**-----------------------------------------------------------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- අමාත්‍යාංශය ඉදිකළ ආපනශාලාව බදුදීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 මාර්ගෝපදේශය ප්‍රකාර තරඟකාරී මිලගණන් කැඳවීමෙන් බදුකරුවෙකු තෝරාගැනීමට කටයුතු කර නොතිබුණි.

- පිරිවැය රු.6,516,009 ක් වටිනා ආපනශාලාවේ භාණ්ඩ බදුකරුට පවරා දී තිබුණත්, ඊට ප්‍රමාණවත් ආරක්ෂක තැන්පතුවක් ලබාගෙන නොතිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.13 මාර්ගෝපදේශයට පටහැනිව රු.60,000 ක් වූ ආරක්ෂක තැන්පතුව වාරික 02 කින් ගෙවීමට ඉඩ සළසා දී තිබුණි.

**(ii). අමාත්‍යාංශ පරිශ්‍රයේ ඉදිකිරීම්**

----------------------------------------

අමාත්‍යාංශ ගොඩනැගිල්ලට පිවිසෙන ප්‍රධාන දොරටුව සවිකිරීම,VIP ගරාජ 03 ක් ඉදිකිරීම හා ආපනශාලාව ඉදිරිපිට ගල් ඇතිරීම යන කාර්යයන් රු.1,450,327කට ඉටුකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- මෙම කාර්යයන් සඳහා අමාත්‍යාංශය විසින් ඇස්තමේන්තු පිළියෙල නොකර පුද්ගලික ආයතනයක් විසින් ඉදිරිපත් කළ මිල ගණන් ඇස්තමේන්තු ලෙස සළකා අමාත්‍යාංශ සුළු ප්‍රසම්පාදන කමිටු අනුමැතිය මත මෙම කාර්යයන් එම ආයතනය වෙත පවරා තිබුණි.

- මෙහිදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.3 හා 3.4 මාර්ගෝපදේශ ප්‍රකාර ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නොතිබුණි. එම හේතුවෙන් උපරිම ආර්ථික වාසියක් රජයට සළසා ගැනිමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.8 මාර්ගෝපදේශය ප්‍රකාර හදිසි ප්‍රසම්පාදන කටයුතු මොනවාද යන්න සඳහන් කර තිබියදී ඊට පටහැනිව හදිසි ප්‍රසම්පාදන කටයුත්තක් ලෙස යථෝක්ත කාර්යය ඉටුකරවා ගෙන තිබුණි.

**(ආ) අධිකාර බලයෙන් තොරවූ ගනුදෙනු**

------------------------------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් අධිකාරි බලයකින් තොරව සිදු කර තිබුණු අවස්ථා නිරික්ෂණය විය. එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(i) ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් සඳහා වූ පුහුණු වැඩසටහන් පැවැත්වීම**

--------------------------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

- ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් සඳහා වූ කළමනාකරණ හා ඵලදායීතා ප්‍රවර්ධන වැඩසටහනට වැයකළ රු.822,029 න් රු.467,029 ක් 139-02-03-05-2502 දරන "ධීවර ප්‍රජාව ශක්තිමත් කිරීම" වැය විෂයයට වූ ප්‍රතිපාදනවලින් වැය කර තිබුණි.

- කලාවැව, ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරි පුහුණු මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් 69 දෙනෙකු සඳහා 2014 අගෝස්තු 22 හා 23 දිනයන්හි වැඩමුළුවක් පවත්වා තිබුණි. මේ සඳහා නිලධාරීන් 140 කට ආහාර හා නේවාසිකාගාර පහසුකම් සැපයීමට රු.508,554 ක් වැයකර තිබුණි.

- සියළුම නිලධාරීන්ට පුහුණු මධ්‍යස්ථානයට යැමට සහ ඒමට රු.72,800 ක් වැය කර පුද්ගලික ආයතනයකින් විශේෂ බස්රථයක් ලබාගෙන තිබුණද, ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් අමාත්‍යාංශයේ වාහනවලින් ද ගමන් කිරීම හේතුවෙන් ඒ සඳහා ඉන්ධනවලට රු.74,918 ක් වියදම් කර තිබුණි.

- පෞද්ගලික මට්ටමින් සහභාගී කරගෙන තිබුණු වැඩමුළුවේ සම්පත්දායකයින්ට පැය 1 විනාඩි 45 ක දේශනයකට රු.30,000 ක්ද, පැය 4 ක දේශනයකට

රු.85,000 ක්ද ගෙවා තිබුණි. එම සම්පත් දායකයන් පත්කර ගැනීම හා ඔවුන් සඳහා ගෙවීම් කිරීමේ පදනම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

- පුහුණු වැඩමුළුව වෙනුවෙන් යොදාගෙන තිබුණු අමාත්‍යාංශයේ වාහන 03 ක් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාව අනුව එම කාලය තුළ කිලෝමීටර් 2,338 ක් ධාවනය කර තිබුණි. එම වැඩමුළුව පැවැත්වූ කාල සීමාව තුළදී කලාවැව, තඹුත්තේගම, කැකිරාව, ගල්ගමුව හා එප්පාවල ආදී ප්‍රදේශවල කිලෝමීටර් 573 ක් ධාවනය කිරීම මතභේදයට තුඩුදෙන්නක් විය.

**3.16 පාඩු හා හානි**

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 අගෝස්තු 11 දින මාතලේ ප්‍රදේශයේදී අමාත්‍යාංශය සතු වාහනයක් එම ප්‍රදේශයට අදාලව රාජකාරි පැවරුමක් හෝ වාහනය බාරව ගමන් කළ නිලධාරියෙකු හෝ නොමැතිව ධාවනය කරමින් තිබියදී අනතුරට ලක්ව තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). එම අනතුර වන අවස්ථාවේදි අමාත්‍යාංශයේ රියදුරෙකු විසින් එම වාහනයේ රියදුරු වශයෙන් කටයුතු කර නොතිබුණි.

(ii). අනතුරට සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(iii). අනතුරට පත් වාහනය අලුත්වැඩියාව සඳහා වූ ඇස්තමේන්තුව රු.512,000 ක්වූ අතර වාහනය මාතලේ සිට කොළඹට රැගෙන ඒමට රු.24,000 ක අමාත්‍යාංශය වැය කර තිබුණි. අදාල රක්ෂණ සමාගමෙන් අනතුර සඳහා අයකරගත හැකි උපරිම වටිනාකම රු.300,000 ක් වූ බැවින් අනතුර හේතුවෙන් වූ රු.238,080 ක අලාභය අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනිමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

(iv). විගණිත දිනය වූ 2015 අගෝස්තු 15 දින වන විටත් වාහනය අලුත්වැඩියා කර ධාවනයට එක්කර නොතිබුණු අතර වසර 02 කට ආසන්න කාලයක් ස්වාභාවික ආපදාවන්ට ලක්වෙමින් ගරාජයක් තුළ ගාල් කර තිබුණි.

(v). මෙම වාහනයේ 2013 ජුලි හා අගෝස්තු මාසවල දෛනික ධාවන සටහන්, අනතුරට අදාලව අමාත්‍යාංශය මගින් පැවැත්වූ පරීක්ෂණ පිළිබඳ තොරතුරු හා මාතලේ උසාවියේ පවරා ඇති නඩුව සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි..

(ආ) වාහනයට සිදු වූ අනතුරකින් රු.939,173 ක අලාභහානියක් සිදු වී තිබුණි. එම අලාභහානි වාහන අනතුරු ලේඛනයේ සටහන් කර නොතිබුණි. රක්ෂණ සමාගමෙන් ගෙවීම් ප්‍රතික්ෂේප කළ එම අලාභයන් අනියම් පදනම මත සේවයේ යොදා ගෙන තිබුණු 2014 දෙසැම්බර් 31 දින වන විට සේවයෙන් ඉවත්වූ රියදුරුගෙන් සිදු වි තිබුණි. එම අලාභයන් අදාළ වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග අමාත්‍යාංශය විසින් ගෙන නොතිබුණි.

(ඇ) අමාත්‍යාංශය සතු වාහන 16 ක් සමාලෝචිත වාර්ෂයේදි හා ඉකුත් වර්ෂවලදි අනතුරුවලට ලක්වී අලාභහානි සිදු වි තිබුණි. එම අලාභහානි සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් මුදල් රෙගුලාසි 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඉ) බදු මුදල් නිවැරදිව ගණනය නොකිරීම හේතුවෙන් හික්කඩුව හා පානදුර ධීවර වරාය සංවර්ධන කටයුතු සිදුකළ සමාගමට අඩුවෙන් ගෙවූ රු.11,159,159 ක බදු මුදල හා ඊට අදාල පොලිය රු.15,098,897 ක් අධිකරණ නියෝග මත 2010 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලබේ.

(i). 2010 ජනවාරි 13 දින සිදු කළ අභ්‍යන්තර පරීක්ෂණයකට අනුව රු.15,098,897 ක අලාභය නිලධාරීන්ගේ අක්‍රමිකතාවයක් හෝ ප්‍රමාදයක් හේතු වී නොතිබුණු බව වාර්තා කර තිබුණද, පහත සඳහන් නිරීක්ෂණයන් හේතුවෙන් එම අලාභයන් නිලධාරීන්ගේ නොසැළකිල්ල හා ප්‍රමාදය නිසා සිදු වී තිබුණි. එබැවින් එම අලාභයන් පාඩු පිළිබඳ ලේඛනයට ඇතුළත් කර නොතිබුණු අතර, අදාළ වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

- බදු සංශෝධනයන්ට අනුකූලව ගිවිසුම සංශෝධනය කර ගැනීමට අදාල නිලධාරීන් කටයුතු කළයුතු වූ අතර ගෙවීම්වල නිවැරදිභාවය සම්බන්ධයෙන් ගෙවීම් අනුමත කරන නිලධාරින් වගකිව යුතු විය.
- නඩු තීන්දුව 2007 ජනවාරි 26 දින ලබාදී තිබුණු අතර එම තීන්දුව ප්‍රකාරව ගෙවීම් සිදුකරන දිනය දක්වාම පොලිය ගෙවිය යුතු වූ බැවින් අදාල ගෙවීම කඩිනම් කර ගැනීමට නිලධාරින් කටයුතු කළ යුතුව තිබුණද නඩු තීන්දු පිටපත ලබාගැනීමට 2009 පෙබරවාරි 25 දක්වාද, අභියාචනා කළ නොහැකි බව 2009 අප්‍රේල් 29 දින නීතිපති දන්වා එවීමෙන් පසු භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමට 2009 ඔක්තෝබර් 19 දින දක්වාද ප්‍රමාද කිරීම සම්බන්ධයෙන් අදාල නිලධාරින් වගකිව යුතු විය.
- 2009 ප්‍රතිපාදනවලින් ගෙවීම්කර වගකිව යුතු නිලධාරීන්ගෙන් ආපසු අයකර ගන්නා ලෙස ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලේකම්වරයාට 2009 දෙසැම්බර් 16 දින දන්වා තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ii). මේ සම්බන්ධ පරීක්ෂණයක් සිදු කිරීමට 2013 ජනවාරි 13 දින පාර්ලිමේන්තු ගිණුම් කාරක සභා රැස්වීමේදී නියෝග කර තිබුණද ඒ අනුව පරීක්ෂණයක් සිදුකර වාර්තාවක් යැවීමට විගණිත දිනය වූ 2015 අගෝස්තු 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඊ) අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ හයවන මහලේ නවීකරණ කටයුතු කිරීමේදී සමස්ථ කාර්ය වෙනුවෙන් පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොගැනීම හේතුවෙන් වැඩිපුර මිලදී ගත් අමුද්‍රව්‍ය වෙනුවෙන් වැය කළ රු.159,477 ක මුදල අමාත්‍යාංශයට සිදුවූ පාඩුවක් විය.

## 3.17 අනාර්ථික ගනුදෙනු

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### 3.17.1 ඉන්දීය සාගර මත්ස්‍ය සමුළුව

2014 මැයි 26 දින සිට ජුනි 05 දින දක්වා ඉන්දීය සාගර මත්ස්‍ය සමුළුව සහ ඊට සමගාමීව මූල්‍ය හා පරිපාලනය පිළිබඳ ස්ථාවර කමිටුවේ 11 වෙනි සැසිය හා අනුකූලතා කමිටුවේ 11 වෙනි සැසිය යන සමුළු තුන ශ්‍රී ලංකාවේදී පැවැත්වීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත කමිටු රැස්වීම් සඳහා ශාලා පහසුකම් බණ්ඩාරනායක ජාත්‍යාන්තර සම්මන්ත්‍රණ ශාලාවෙන් ලබාගැනීමේදී රු.460,625 ක අධිභාරය අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණත්, එම අධිභාරය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සමුළු ත්‍රිත්වය සඳහාම සහභාගි වූ විදේශීය හා දේශීය නියෝජිත සංඛ්‍යාව පිළිවෙලින් 328 ක් හා 44 ක් විය. නමුත් 500 දෙනෙකුට ලියකියවිලි බහාලුම් හා සමරු තිළිණ මිලදීගෙන තිබුණි. ඒ අනුව ලියකියවිලි බහාලුම් 128 කට රු.76,800 ක්ද විදේශීය නියෝජිතයින්ට මිලදී ගත් ශ්‍රී ලාංකික කුළුබඩු ඇතුළත් සමරු තිලිණ 172 කට රු.385,280 ක්ද අවශ්‍යතාවයට වැඩියෙන් අමාත්‍යාංශය විසින් වියදම් කර තිබුණි. ඉතිරි සමරු තිළිණ සම්බන්ධයෙන් කටයුතු කළ ආකාරය පිළිබඳ තොරතුරු විගනනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) සමුළුව කළමණාකරනය කිරිමට මිල ගණන් කැඳවා පුද්ගලික ආයතනයක් තෝරා ගෙන එකී ආයතනය සමග අමාත්‍යාංශය අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණු අතර, එම ආයතනය ඉදිරිපත් කළ රු.19,840,552ක බිල්පත්වලට 2014 දෙසැම්බර් 31 දින වන විට රු.16,522,867 ක් ගෙවා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමුළුවට අදාල රූපවාහිනී හා ගුවන් විදුලි දැන්වීම් ප්‍රචාරණ කිරිම සඳහා කුමන නාලිකා තෝරා ගත යුතුද, කවර පුද්ගලයින් සහභාගී කරගත යුතුද, දැන්වීම් අන්තර්ගතය හා ප්‍රචාරණ කාලය සම්බන්ධයෙන් සේවා සැපයුම්කරු දැනුවත්කර නොතිබුණි.

(ii) පෞද්ගලික මාධ්‍ය ආයතනයක ගුවන් විදුලි දැන්වීමක් විසුරුවා හැරීමේ ඉන්වොයිස් පතකට රු.1,713,600 ක් ද රූපවාහිනී දැන්වීම් ප්‍රචාරණය වෙනුවෙන් පෞද්ගලික මාධ්‍ය ආයතනයක් ඉදිරිපත් කළ ඉන්වොයිස් පතක ඡායා පිටපතකට රු.3,976,409 ක් ගෙවා තිබුණි. එම ඉන්වොයිස්පත් කුමන කරුණක් අරභයා, කුමන ආයතනයක් වෙනුවෙන් වූ දැන්වීම් ප්‍රචාරණයට ඉදිරිපත් කරන ලද්දක්ද යන්න හා මෙම දැන්වීම්වලට අදාල දිනය, වේලාව, ගුවන් කාලය හා ප්‍රචාරණ වාර ගණන යනාදී විස්තර කිසිවක් ලබාගෙන නොතිබුණු අතර අදාල මාධ්‍ය ආයතනවලින් ලබාගත් කුවිතාන්සිද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iii) සමුළුවේ සමාරම්භක දිනයේදී සමුළුව පිළිබඳ විශේෂ පණිවිඩයක් (Special count down) ඇතුළත්ව ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ මාධ්‍ය පුවත්පත් තුනක සම්පූර්ණ පිටුවක් ආවරණය වන පරිදි පුවත්පත් දැන්වීම් පළ කළ යුතු බවට අවබෝධතා ගිවිසුම මඟින් දැනුවත් කර තිබුණි. ඒ සඳහා රු.1,850,000 ක් වැයකර සිංහල පුවත්පත් දෙකක සහ ඉංග්‍රීසි පුවත්පතක දැන්වීම් පළ කර තිබුණද දෙමළ පුවත්පතක දැන්වීම පළ කිරීමට කටයුතු කර නොතිබුණි. මෙහිදී සිංහල පුවත්පත් 02 ක දැන්වීම පළ කිරීම හේතුවෙන් වැඩිපුර සිංහල දැන්වීමක් පළ කිරීමට රු.493,920 ක ගෙවීම අනුමැතියකින් තොරව සිදුකර තිබුණි.

(iv) පුවත්පත් දැන්වීම් සඳහා ඉදිරිපත් කර තිබුණු බිල්පත් වටිනාකම රු.1,507,520 ක් වූයෙන් රු.342,480 ක් වැඩිපුර සේවා සැපයුම්කරුට ගෙවා තිබුණි.

(v) අදාල සේවා සැපයුම්කරු මිල ගණන් ඉදිරිපත් කිරීමේදී සමුළු නියෝජිතයින් 500 ක් නවාතැන් ගත් කොළඹ හෝටල්වල සිට බණ්ඩාරනායක ජාත්‍යාන්තර සම්මන්ත්‍රණ ශාලාව දක්වා දින 10 ක් සුඛෝපභෝගී කාර්, වෑන්, බස්රථ යොදාගෙන ප්‍රවාහනය කිරීමට රු.1,650,000 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. සමුළුවට සහභාගී වූ මුළු විදේශ නියෝජිතයන් සංඛ්‍යාව 328 ක් වූ බැවින් ප්‍රවාහන පිරිවැයද සාපේක්ෂව අඩුවිය

යුතුව තිබුණද, විස්තරාත්මක බිල්පත් ඉදිරිපත් කිරීමකින් තොරව මුළු මුදලම බිල්පත්වලට ඇතුළත් කර තිබුණි.

(vi) සමුළුවේ සමාරම්භක උත්සවයට VVIP ආරාධනාපත්‍ර 200 ක් රු.370,000 කට මුද්‍රණය කිරීම අනුමත කර තිබුණි. ආරාධනාපත්‍ර 250 ක් මුද්‍රණය කිරීම හේතුවෙන් ඉල්ලීමක් හෝ අනුමැතියක් රහිතව අවශ්‍යතාවයට වැඩියෙන් මුද්‍රණය කළ ආරාධනාපත් 50 කට රු.92,500 ක් ගෙවා තිබුණි.

(vii) 2014 ජුනි 01 දින කොළඹ හෝටලයක පැවති සමුළුවට අදාල රාත්‍රී භෝජන සංග්‍රහය සහ 2014 ජුනි 03 දින තවත් කොළඹ හෝටලයක පැවැති සමුගැනීමේ සාදය වෙනුවෙන් එකතුව රු.2,085,141 ක බිල්පත් අමාත්‍යාංශය විසින් සෘජුවම එම හෝටල්වලට පියවා තිබුණි. සේවා සැපයුම් ආයතනයද එම බිල්පත් වටිනාකම තම ඉන්වොයිස්පත්‍රයට ඇතුළත් කර හෝටල බිල්පත් වටිනාකම ඉන් අඩුකර තිබීම හේතුවෙන් සියයට 15 ක උත්සව කළමනාකරණ ගාස්තුව වශයෙන් රු. 312,000 ක් වැඩිපුර එම ආයතනයට ගෙවා තිබුණි.

(viii) සේවා සැපයුම් ආයතනය විසින් සමුළු නියෝජිතයන්ට ලිපිගොනු රුඳවුම් 500 ක් සැපයීමට රු.795,000 ක ඇස්තමේන්තු කළද සත්‍ය වියදම රු.662,500 ක් වුවත් ගෙවීම් කිරීමේදී ඇස්තමේන්තුව පදනම් කරගෙන උත්සව කළමනාකරණ ගාස්තුව ගණනය කිරීම හේතුවෙන් රු.19,875 ක් එම ආයතනයට වැඩිපුර ගෙවා තිබුණි.

**3.17.2 ධීවර ප්‍රජාවගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා වූ ස්වයංරැකියා වැඩ පිළිවෙල**

මීගමුව දිස්ත්‍රික්කයේ ධීවර ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය කිරීමට ධීවර පවුල්වල කාන්තාවන්ට ස්වයංරැකියා පුහුණුව හා ස්වයං රැකියා සඳහා අවශ්‍ය උපකරණ ලබාදීමේ ව්‍යාපෘතියක් සඳහා රු.10,438,320 ක් වැය කර උපකරණ මිලදී ගෙන තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණන් කරනු ලැබේ.

(අ) භාණ්ඩ වර්ග 18 ක් මිලදී ගැනිම සඳහා ආයතන 03 කින් මිල ගණන් ලබා ගෙන තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව අඩුම මිල ගණන් ඉදිරිපත් කළ ආයතනයෙන් එම භාණ්ඩ මිලදී නොගෙන රාජ්‍ය ආයතනයකින් රු.10,438,320 කට මිලදී ගෙන තිබුණි. ඒ නිසා එම ප්‍රසම්පාදනයෙන් රු.1,341,856 ක මූල්‍යමය අවාසියක් සිදු වී තිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 29 හා 30 දිනයන්හි භාණ්ඩ සැපයූ බවට එම සමාගම ඉදිරිපත් කළ ඉන්වොයිස් පත් අනුව හා දැන්වීම් අනුව රු.1,194,380ක උපකරණ භාරදුන් බවට හෝ භාරගත් බවටද, රු.8,524,520 ක් වටිනා උපකරණ මීගමුව දිස්ත්‍රික් ධීවර කාර්යාලය මගින් භාරගත් බවටද, තහවුරු වී නොතිබුණි. 2014 දෙසැම්බර් 31 දින සැපයුම්කරුට රු.10,516,095 ක් ගෙවීමට චෙක්පතක් පිළියෙල කළ පසුව එය අවලංගු කර 2015 පෙබරවාරි 10 දින පොදු තැන්පත් ගිණුමේ එම මුදල් තැන්පත් කර තිබුණි.

(ඇ) ගෙවීම් බිල්පත්වල ඇතුළත්ව තිබුණු එකතුව රු.796,895 ක් වටිනා ගෑස් ලිප් 04 ක් සහ කාන්තා බයිසිකල් 53 කට ඉන්වොයිස්පත් නිකුත් කර නොතිබු අතර ඒවා භාර ගත් බවට කිසිදු සහතිකයක්ද ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) පැන්සල් පෙට්ටි හා ගණිත උපකරණ 600 ක් බැගින් වූ ඒකක 1,200 ක් නිකුත් කළ බව සඳහන් කර රු.217,800 ක් වූ ඉන්වොයිස්පතකට ගෙවීම් කර තිබුණි. එවැනි උපකරණ මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියක් ලබාගෙන හෝ ඇණවුම් කර හෝ නොතිබුණි.

(ඉ) ඉහත සඳහන් උපකරණ මිලදී ගැනීම හා බෙදාහැරීම සම්බන්ධව පහත සඳහන් මතභේදයට තුඩුදෙන අවස්ථාද විගණනයේදී නිරීක්ෂණය විය.

(i). 2014 අයවැය ඇස්තමේන්තු මගින් ස්වයං රැකියා පුහුණුව හා උපකරණ බෙදාහැරීම සඳහා ප්‍රතිපාදන සළසා නොතිබුණු අතර 2014 වර්ෂයේ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම අනුවද එවැනි කාර්යයක් ඇතුළත් කර නොතිබුණි.

(ii). ධීවර ප්‍රජාවගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා ස්වයං රැකියා ව්‍යාපෘති 06 ක් මගින් ප්‍රතිපාදන සළසා තිබුණි. ඉන් එක් ව්‍යාපාතියකින් කරවල නිෂ්පාදනය හා අලෙවිය සෘජු ධීවර ආශ්‍රිත කර්මාන්තයක් ලෙස සළකා ඒ සඳහා රු.102,500 ක් වැය කර තිබුණි. ඉහත සඳහන් වැඩසටහන යටතේ උපකරණ බෙදාදීමේ මෙම ව්‍යාපෘතිය අතහැර තිබුණි. ඒ අනුව මෙම වැඩසටහන මගින් මැහුම් කර්මාන්තය, ආහාර සැකසීම, කුළුබඩු නිෂ්පාදනය, කුකුල් පාලනය හා මල්වගාව යන ධීවර කර්මාන්තය ආශ්‍රිත නොවූ ව්‍යාපෘතිවලට රු.10,516,095 ක් වැය කර තිබුණි.

(iii). වැඩ බලන ධීවර අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ ස්වයංරැකියා සඳහා වූ උපකරණ ලැයිස්තුව, ස්වයං රැකියා පුහුණුව ලබා දුන් ව්‍යාපෘතිවලට අදාලවූ ඒවා බවටත්, උපකරණ බෙදාහැරීම සම්බන්ධ විස්තර විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම උපකරණ ස්වයං රැකියා පුහුණුව ලබා දුන් අයට භාරදී තිබුණු බව විගණනයේදී තහවුරු කර ගැනිමට නොහැකි විය.

(iv). මෙම වැඩ සටහන යටතේ ස්වයංරැකියා සඳහා ලබාදීමට රු.4,476,879 ක් පිරිවැය වූ ජුකී මහන මැෂින් 121 ක්ද, වටිනාකම රු.726,895 ක්වූ කාන්තා බයිසිකල් 53 ක් හා වටිනාකම රු.217,800 ක් වූ පාසල් උපකරණ කට්ටල 120 මිලදී ගැනිම මතභේදාත්මක වි තිබුණි.

**3.18 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 22 | 19 | 03 |
| (ii) | තෘතියික මට්ටම | 05 | 01 | 04 |
| (iii) | ද්විතියික මට්ටම | 126 | 90 | 36 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 56 | 54 | 02 |
| | **එකතුව** | **209** | **164** | **45** |

## 4. ශීර්ෂය 290 - ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

---

### 4.1 විසර්ජන ගිණුම

**අයවැය විචලනයන්**

වැය විෂයයක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම නිසා සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනයන් කළ පසු ඉතිරිය රු.1,951,163 ක් හෙවත් සියයට 91.69 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් ඉතිරිකර තිබුණි.

### 4.2 ආදායම් ගිණුම්

අධ්‍යක්ෂ ජනරාල්වරයා ආදායම් ගණන්දීමේ නිලධාරි වශයෙන් ආදායම් සංකේතයක ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්ය භාරය පැවැරි තිබුණි. එම ආදායම් සංකේතයට අදාලව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2014 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව අනුව ආදායම් ඇස්තමේන්තුව රු.12,000,000 ක් වුවද විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුමෙහි ඇස්තමේන්තුගත ආදායම රු.7,369,000 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) ආදායම් ඇස්තමේන්තු කිරීම, එකතු කිරීම, අධීක්ෂණය කිරීම හා ලේඛනගත කිරීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාපටිපාටින් හඳුන්වා දී ක්‍රියාත්මක කර නොතිබුණි.

### 4.3 පොදු තැන්පත් ගිණුම

හිමිකම් පෑමේ කාලය ඉකුත් වු සියළුම තැන්පතු පිළිබඳව මුදල් රෙගුලාසි 570 ප්‍රකාරව සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම ලැයිස්තුවක් පිළියෙල කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

### 4.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 29001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු රු.1,067,982 ක ණයශේෂ වර්ෂ 01 සිට වර්ෂ 18 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි

(ආ) ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 1.6 වගන්තිය හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව නිලධාරියෙකු ස්ථාන මාරු වීම් ලබා මාස 03 ක් ගතවීමෙන් පසු දෙපාර්තමේන්තු අතර නිරවුල් නොවු ණය ශේෂ නොපෙන්විය යුතු වුවත්, එක් නිලධාරියෙකුගේ රු.150,700 ක ණය ශේෂ 2014 දෙසැම්බර් 31 දින වන විටද නිරවුල් කර නොතිබුණි.

(ඇ) විශ්‍රාමික නිලධාරීන් දෙදෙනකුගෙන් අයවිය යුතු එකතුව රු.47,069 ක ණය ශේෂ 2 ක් වර්ෂ 18 ක් හා වර්ෂ 11 ක කාලයක සිට පැවැත එමින් තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ශේෂ නිරවුල් කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ඈ) ඇපකරු මිය ගිය හා ඇපකරුවන් නොමැති ධූරය හැරගිය නිලධාරීන්ට අයත් වර්ෂ 2 ක සිට වර්ෂ 22 දක්වා කාල පරාසයක සිට පැවැත එන එකතුව රු.366,502 ක ණය ශේෂ අයකර ගැනිමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නොහැකි වී තිබුණි.

(ඉ) වැඩ තහනම් කළ නිලධාරීන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.654,410 ක ණය ශේෂයන් ගෙන් කිසිදු ණය ශේෂයක් ආපසු අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබුණි. මෙම නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ සම්බන්ධව නීතී ක්‍රියාමාර්ග 2015 අගෝස්තු 31 දින වන විටත් අවසන් වි නොතිබුණි.

## 4.5 අභ්‍යන්තර විගණනය

------------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කර ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

## 4.6 වත්කම් කළමනාකරණය

--------------------------

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

### (අ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

--------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් මෝටර් රථ 03 ක් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට අවිධිමත් ලෙස වර්ෂ 03 කට අධික කාලයක සිට මුදාහැර තිබුණි.

### (ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම

------------------------------------------------------------

කාර්මික පුහුණු ආයතනය සතුව තිබුණු මෝටර් රථයක් සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය සතු මෝටර් රථ 02 ක් විධිමත් අනුමැතියකින් තොරව දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණි.

### (ඇ) වාහන ලේඛනය විධිමත්ව නොපැවැත්වීම

---------------------------------------------

විසර්ජන ගිණුමේ ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබු එකතුව රු.76,585,343 ක වාහන සම්බන්ධයෙන් අදාල වටිනාකම් ඇතුළත් ලේඛනයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**4.7 බේරුම් නොකළ බැරකම්**

---------------------------

දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම්වල එකතුව රු.574,534,643 ක් වූ අතර, ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් ලේඛනයක් පිළියෙළ කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව යම් වැය විෂයයක වියදම් සහ බැරකම් ප්‍රමාණය මුදල් වර්ෂයේ ප්‍රතිපාදන නොඉක්මවිය යුතු වුවද, වැය විෂයයන් 2 කට සමාලෝචිත වර්ෂයේදි සළසා දී තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිවීම් ඉක්මවා රු.1,318,503 ක බැරකම්වලට එළඹ තිබුණි.

**4.8 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-----------------------------------------------

ධීවරයින්ට බෙදාහැරීමට මිලදීගත් රු.49,994,320 ක ජීවිතාරක්ෂක කබා සැපයුම්කරු විසින් සෘජුවම දිස්ත්‍රික් ධීවර කාර්යාලවලට සපයා තිබුණද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.1 හා 8.12.3 මාර්ගෝපදේශ ප්‍රකාරව නියමිත පිරිවිතරයන්ට අනුකූලව එම කබා පැවැති බව තහවුරු කර නොගෙන ගෙවීම් කර තිබුණි.

**4.9 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

----------------------------------------

දෙපාර්තමේන්තව විසින් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරික්ෂාවලින් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) ඉන්ධන සහනාධාරය වෙනුවට විකල්ප සහනාධාර යෝජනා ක්‍රමයක් ලෙස ධීවර දැල් ලබාදීමේ ව්‍යාපෘතිය**

----------------------------------------------------------------------------------------------

ඉන්ධන සහනාධාරලාභී ධීවර යාත්‍රා 23,000 ක් අතරින් යාත්‍රා 14,811 කට ඉන්ධන සහනාධාරය වෙනුවට විකල්ප සහනාධාර ක්‍රමයක් ලෙස එක් යාත්‍රාවකට රු.112,500 ක් වටිනාකමැති ධීවර දැල් සහ ජීවිතාරක්ෂක කබා ලබාදීමට ලංසු කැඳවා කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ධීවර දැල් සැපයීම සඳහා රාජ්‍ය සමාගමක් විසින් ලංසු ඉදිරිපත් කර තිබුණි. එම සමාගම විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8.4 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු සුරක්ෂණ ඉදිරිපත් නොකිරීමේ හේතුවෙන් ලංසු ඇගයීමේදි තාක්ෂණ ඇගයීම් කමිටුව එම සමාගම ඇගයීම්වලින් ඉවත් කර නොතිබුණි.

(ii) ධීවර දැල් මිලදී ගැනීමේ ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 50 ට වැඩි ප්‍රසම්පාදන 6 ක් සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශයට පටහැනිව අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුව වෙනුවට දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුවක් විසින් අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු කර තිබුණි.

(iii) මුළු පිරිවැය රු.මිලියන 1,190.36 ක ධීවර දැල් මිලට ගැනීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 1,156.12 ක ධීවර දැල් රාජ්‍ය සමාගමකින් මිලදී ගෙන තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5:4.10 මාර්ගෝපදේශය ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණයන් ලබා ගැනීමට හා ඊට අදාල රු.මිලියන 223.91 ක අත්තිකාරම් ගෙවීමේදි රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4(1) මාර්ගෝපදේශය ප්‍රකාරව අත්තිකාරම් සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි.

(iv) ධීවර දැල් ලබාදීමේ ව්‍යාපෘතියට අදාල සියළුම ධීවර දැල් 2014 නොවැම්බර් 19 දින වන විට සපයා අවසන් කළ යුතු වුවද, අදාල රාජ්‍ය සමාගම විසින් ඇණවුම් 27 කට අදාල එකතුව රු.554,248,095 ක් වටිනා ධීවර දැල් සැපයීමට විගණිත දිනය වූ 2014 දෙසැම්බර් 31 දින වන විටත් අපොහොසත් වී තිබුණි. තවද, කොන්ත්‍රාත්කරු සපයා තිබුණු දැල් දින 42 සිට දින116 ක් දක්වා කාල පරාසක ප්‍රමාදයන් සිදු කර තිබුණි.

(v) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9 මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත් පිරිනැමීමේදී කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව කොන්ත්‍රාත්කරුවන් සමඟ අවිධිමත් ලෙස අවබෝධතා ගිවිසුම්වලට එළඹ තිබුණි. එකී ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීමට කොන්ත්‍රාත්කරු අසමත් වුවහොත් ඉතිරිවූ කොටස් හැකි ඉක්මනින් සම්පූර්ණ කිරීමට එකඟවී තිබූ බැවින් සැපයීම ප්‍රමාදවීම හෝ සැපයීමට අසමත්වීම මත වන අලාභ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව නීතිමය ආවරණයක් ලබාගෙන නොතිබුණි.

(vi) අදාල රාජ්‍ය සමාගමට ලබාදුන් රු.මිලියන 223.91 ක අත්තිකාරම්වලින්, ප්‍රදානය කළ කාර්ය සම්පූර්ණ නොකර රු.42,682,320 ක් අත්තිකාරම් දින 90 සිට දින 132 දක්වා කාල පරාසයක් අත රඳවාගෙන සාවද්‍ය ලෙස වෙනත් ඇණවුම්වලට අදාල වවුචර්වලින් පියවා තිබුණි. මෙහිදී ගෙවීම් අනුමත කිරීම සහ සහතික කිරීමේදී මුදල් රෙගුලාසි 137 හා 138 කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. .

(vii) ධීවර දැල් සැපයීම සඳහා පෞද්ගලික සමාගමකට ප්‍රදානය කළ රු.37,939,520 ක කොන්ත්‍රාත් 09 ක් අතරින් 2014 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික්ක 02 කට අදාලව රු.9,970,400 ක් වටිනා දැල් සැපයීම එම සමාගම සම්පූර්ණයෙන්ම පැහැර හැර තිබුණු අතර ඉතිරි දිස්ත්‍රික්ක 07 ට අදාලව රු.27,969,120 ක් වටිනා දැල් වර්ග සැපයීම ප්‍රමාද කර තිබුණද, දෙපාර්තමේන්තුව මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් 2015 මාර්තු 31 දින දක්වා ගෙන නොතිබුණි.

(viii) දිස්ත්‍රික් කාර්යාල 08 කට සැපයිය යුතු දැල් කට්ටල 8,216 කින් දැල් කට්ටල 6,184 ක් පමණක් සැපයුම්කරුවන් විසින් සපයා තිබුණු අතර 2015 මාර්තු මාසය වන විටද දැල් කට්ටල 2,702 ක් ප්‍රතිලාභීන්ට නොබෙදා දිස්ත්‍රික් කාර්යාලවල රඳවාගෙන තිබුණි.

(ix) ප්‍රසම්පාදනය ආරම්භ කිරීමට පෙර එක් එක් දිස්ත්‍රික්කවල දැල් අවශ්‍යතාවය හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

(x) දැල් ඇනවුම් කිරීමේදී එම ඇණවුම්වල පිටපත් දිස්ත්‍රික් කාර්යාලවලට නොලැබීම හා සැපයූ දැල් ඇණවුමට අනුකූල වන්නේද යන්න පරීක්ෂා කර භාර නොගැනීම මත ඇණවුම් හා සැපයුම් අතර විචලතා තිබුණි.

(xi) ධීවරයින්ගේ අවශ්‍යතාවයට අනුකූල නොවන දැල් සපයා තිබීම හේතුවෙන් ඔවුන් දැල් ලබාගැනීම ප්‍රතික්ෂේප කළ අවස්ථා තිබුණු අතර ඇණවුම්වලට අනුකූලව සපයා නොතිබුණු දැල් සඳහා ගෙවීම් නොකළ යුතු වුවද, ඒ සඳහාද ගෙවීම් කර තිබුණි.

**(ආ) දිවි නැගුම ධීවර පසු අස්වනු තාක්ෂණික ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය**

**-----------------------------------------------------------------------------------**

දිස්ත්‍රික්ක 15 ක තාක්ෂණික පුහුණුව ලැබූ ප්‍රතිලාභින් 2,675 දෙනෙකුට රු.10,000 බැගින් ණය මුදලක් ලබාදීමට 2012 වර්ෂයේදි මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් රු.මිලියන 26.75 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. වසරක් ගතවීමෙන් පසු ණය ලබාදීමේ ප්‍රගතිය පහළ මට්ටමක පැවතීම හේතුවෙන් එම අමාත්‍යාංශය වෙත රු.මිලියන 10 ක් ආපසු යැවීමට සිදුවී තිබීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ණය ව්‍යාපෘතිය චක්‍රීය අරමුදලක් ලෙස ක්‍රියාත්මක කර තිබුණු අතර 2014 ඔක්තෝබර් 15 දින වන විට ප්‍රතිලාභින් 2,109 කට රු.21,090,000 ක ණය ප්‍රදානය කර තිබුණු අතර, එය අපේක්ෂිත ඉලක්කයෙන් සියයට 79 ක් විය.

(ii) මෙම ණය මුදලෙන් සියයට 16 ක් එනම් රු.3,386,417 ක් ණය මුදල් ගෙවීම පැහැර හැර හෝ ප්‍රමාද කර හෝ තිබුණු අතර ණය වාරික අයකර ගැනිම සම්බන්ධයෙන් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශිය මට්ටමේ නිලධාරින්ගේ සහභාගීත්වය ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

(iii) මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට ලංකා බැංකුවේ 2012 සැප්තැම්බර් 17 දින තැන්පත් කළ රු.මිලියන 16.75 ක තැන්පතුව සම්බන්ධයෙන් විගණනයට ඍජු ශේෂ තහවුරුවක් ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) කිලිනොච්චි දිස්ත්‍රික් ධීවර කාර්යාලය ඉදිකිරීම**

**---------------------------------------------------**

කිලිනොච්චි දිස්ත්‍රික් ධීවර කාර්යාලය ඉදිකිරීම සඳහා එකතු කළ අගය මත බදු හැර රු.22,172,,055 ක වියදම් ඇස්තමේන්තුවට කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් විසින් ලංසු කැඳවා රු.14,346,910 ක අවම මිල ඉදිරිපත් කළ ආයතනයට කොන්ත්‍රාත්තුව පිරිනැමීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය විය.

(i) තෝරාගත් මිල, දෙපාර්තමේන්තු ඇස්තමේන්තුවට වඩා සියයට 35 කින් එනම් රු.7,825,145 කින් අඩුවී තිබීම හේතුවෙන් කාර්යයයේ ගුණාත්වය සම්බන්ධයෙන් ඇතිවිය හැකි ගැටලු පිළිබඳව මෙහිදී සැලකිලිමත් වී නොතිබුණි.

(ii) කොන්ත්‍රාත්කරු විසින් ඉහත ගොඩනැගිල්ල ඉදිකිරීමට එකඟ වූ මිල එකතු කළ අගය මත බදු සහිතව රු.16,068,539 ක් වුවද, ඒ සඳහා රු.20,000,000 ක් කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් වෙත මුදාහැර තිබුණි.

(iii) 2014 ඔක්තෝබර් 29 දිනට වැඩ අවසන් කර භාරදිය යුතුව තිබුණු මෙම ගොඩනැගිල්ල විගණිත දිනය වූ 2015 මැයි වන විටද නිම කර භාරදී නොතිබුණි.

**4.10 කාර්යසාධනය**

2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා කාර්යසාධන වාර්තා අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) ක්‍රියාකාරී සැලැස්ම අනුව නව ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමයට ධීවරයින් 750 ක් ඇතුළත් කර ගැනීමට ඉලක්ක කර තිබුණද, වර්ෂය තුළ ඒ සඳහා කිසිදු ධීවරයකු බඳවාගෙන නොතිබුණි.

(ii) මිරිදිය ධීවර යාත්‍රා 7,250 ක් ලියාපදිංචි කිරීමට ඉලක්ක කර තිබුණද වර්ෂය තුල කිසිදු යාත්‍රාවක් ලියාපදිංචි කර නොතිබුණි.

(iii) දෙපාර්තමේන්තු භෞතික කාර්යසාධන වාර්තාව අනුව ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් වැඩසටහන් 09 ක අපේක්ෂිත ඉලක්කයන් කරා ළඟාවීමේ භෞතික කාර්යසාධනය සියයට 10 ක සිට සියයට 70 ක් දක්වා පරාසයක පැවැතුණි.

**4.10 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබූ සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කීපයක් පහත දැක්වේ.

**(අ) මුහුදු කුඩැල්ලන් හා හක්බෙල්ලන් අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම**

මෙ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලබේ.

(i). 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් සංවර්ධන පනතේ විධිවිධානවලට අනුව මුහුදු කුඩැල්ලන් හා හක්බෙල්ලන් ඇල්ලීම, එකතු කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය හා අපනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ බලතල ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත පැවරා තිබුණි. 2011 ඔක්තෝබර් මාසයේ සිට මුහුදු කුඩැල්ලන් හා හක්බෙල්ලන් ඇල්ලීමේ සිට අපනයනය දක්වා කාර්යයන් ඉටු කිරීම සඳහා ලංකා ධීවර සංස්ථාව පෞද්ගලික ආයතන සමඟ ගිවිසුම්වලට එළඹ තිබුණි. කිසිදු නීත්‍යානුකූල අයිතිවාසිකමක් නොමැතිව ලංකා ධීවර සංස්ථාව විසින් සිදු කර තිබුණු උක්ත කාර්යය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් 2014 නොවැම්බර් 10 දින වන විටත් ගෙන නොතිබුණි.

(ii). කිලෝග්‍රෑම් 01 කට රු. 10 ක් බැගින් මුහුදු කුඩැල්ලන් අපනයනය කිරීමට මත්ස්‍ය අපනයනකරුවන්ට බලපත්‍ර ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන අතර ලංකා ධීවර සංස්ථාව විසින්ද එම අපනයන සමාගම් සමඟ ගිවිසුම්වලට එළඹී

තිබුණි. ගිවිසුම්ගත කාලය මාස 03 කට එක් සමාගමකින් රු.500,000 බැගින් අය කර තිබුණි. මෙය අමාත්‍යාංශ තීරණයක් මත බව දක්වමින් අපනයනය කරනු ලබන හක්බෙල්ලන් හා මුහුදු කූඩැල්ලන් කිලෝග්‍රෑම් 01 කට රු. 100 බැගින්ද අය කිරීමට සංස්ථාව කටයුතු කර තිබුණි. ඉතා සහනදායී ගාස්තු ක්‍රමයක් මත මත්ස්‍ය සම්පත කළමනාකරණයට අමාත්‍යාංශය විසින් නීති රීති සකස් කර තිබියදී ලංකා ධීවර සංස්ථාව විසින් මෙලෙස ගිවිසුම්වලට එළඹෙමින් 2011 ඔක්තෝබර් මාසයේ සිට 2014 දෙසැම්බර් මාසය දක්වා සංස්ථාව අයකළ ආදායම රු.31,428,956 ක් හා අපනයනකරුවන්හට ආපසු ගෙවිය යුතු තැන්පතු මුදල රු.14,000,000 ක් විය.

(iii). 2013 වර්ෂයේ විගණකාධිපති වාර්තා මගින් උක්ත කරුණ පෙන්වා දී තිබුණද 2014 නොවැම්බර් වන විටත් දෙපාර්තමේන්තුව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබීම හේතුවෙන් තවදුරටත් මාස 15 කට අධික කාලයක් අනීතික හා අසාධාරණ අන්දමින් මත්ස්‍ය අපනයනකරුවන්ගෙන් මුදල් අයකර ගැනීමට ලංකා ධීවර සංස්ථාවට ඉඩ සළසා දී තිබුණි.

**4.12 නිෂ්කාර්ය වියදම්**
**---------------------**

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**බහුදින ධීවර යාත්‍රා සඳහා දත්ත සටහන් පොත් මුද්‍රණය**
**---------------------------------------------------------**

වාර්ෂිකව ඉන්දීය සාගරයෙන් නෙලා ගනු ලබන මසුන් පිළිබඳ දත්ත ලබාගැනීමේ ඉන්දීය සාගර ටූනා කොමිසමේ අවශ්‍යතාවය වෙනුවෙන් 2015 වර්ෂයේ දත්ත සටහන් කිරීම සඳහා ධීවර දත්ත සටහන් පොත් 5,000 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ආයතන දෙකකින් පමණක් ලබාගත් මිල ගණන් අතුරින් තෝරාගත් ආයතනයට රු.2,796,423 කට කොන්ත්‍රාත්තුව පවරා තිබුණි.

(ආ) මෙහිදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3 මාර්ගෝපදේශය ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගැනීමට හා කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කොන්ත්‍රාත්තුව පැවරීමේදී ධීවර දත්ත සටහන් පොත් 5,000 ක් මුද්‍රණය කර 2014 නොවැම්බර් 02 දිනට පෙර භාරදිය යුතු බව සැපයුම්කරුට දන්වා තිබුණද, සැපයීම දින 100 ක ප්‍රමාදයකින් පසුව 2015 අප්‍රේල් 02 දින සම්පූර්ණ කර තිබුණි.

(ඇ) 2015 වර්ෂයේදී මත්ස්‍ය නිෂ්පාදනය පිළිබඳ දත්ත රැස්කිරීම අරමුණු කර මෙම කාර්යය ආරම්භ කර තිබුණද 2015 වර්ෂය ආරම්භවීමට පෙර සටහන් පොත් නිකුත් කර 2015 වර්ෂය ආරම්භයේ සිට දත්ත රැස්කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල ළඟාකර ගැනීමට නොහැකි වී තිබුණි.

**4.13** **මානව සම්පත් කළමනාකරණය**

**--------------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**------------------------------------------------------**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 48 | 26 | 22 | - |
| (ii) | තෘතියික මට්ටම | 22 | 12 | 10 | - |
| (iii) | ද්විතියික මට්ටම | 881 | 474 | 407 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 107 | 82 | 25 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 3 | - | 3 |
| | එකතුව | 1,058 | 597 | 464 | 3 |